ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

" ධර්මිෂ්ඨකමට සාපිපාසා ඇත්තෝ ආශීර්වාද ලද්දෝය. මක්නිසාද, ඔවුහු තෘප්තියට පැමිණෙන්නෝය." (මතෙව් 5 : 6)

75 වන වෙළුම අංක 11 899 | 2016 නොවැම්බර්

ඇමරිකාවේ එකම බලාපොරොත්තුව

ටෝනි ඒවන්ස් විසිනි

ඇමරිකාව තුළ ගැඹුරු අර්බුදයක් පවතී පවතී මුහුදු දීප්තිමත්ව බැබළෙන් නාක් මෙන් ජාතියට බැබළීමට බලය ලබාදී තිබෙන බවට අපි සාක්ෂිකාරයන් වන්නෙමු මනුෂ්‍යයෝ දේශපාලනික ආසන මත පසෙකින් වාඩි වී සිටියදී වේගයෙන් පටලැමීන් යන්නා වූ කාරණාවන් නිරවුල් කිරීමට සැලකිල්ලට නොගෙන සිටින්නේ ය. විරුද්ධවාදී කම් සහ අසමගිය, භේද බහුල වීමේ ලක්ෂණ නිසා ඇමරිකා එක්සත් ජනපදය වේගයෙන් බෙදීමට ලක්වීමට පුළුවන. පවුල් ස්ථිර ලෙස බිඳ වැටීම තීරණාත්මක මොහොතක පැවතීම නතර කිරීමට වර්ගවාදී ව බෙදී සිටින කොංග්‍රසයට (ඇමරිකා එක්සත් ජනපදයේ මන්ත්‍රී මණ්ඩලයට) නොහැකිව තිබේ. ජාතියක් වශයෙන් අපි පැහැදිලිවම දබර කර ගැනීමට ලක්ව සිටින්නෙමු. එයට සදාචාරාත්මක ගෞරවය පිරිහීමත් එකතුවී අප එයින් වැසී ගොස් ඇත. එම නිසා විවාහය සහ පවුල නැවත නිර්වචනය කළ යුතුව ඇත. ගබ්සා කිරීම අයිතියක් වශයෙන් අවශ්‍ය බව ඉල්ලා සිටීම, මාධ්‍ය නොකඩවා ශිෂ්ට බව බිඳ වැටී නිහඬව සිටීම හෝ අධ්‍යාපනික පද්ධතිය තුළ ආචාර ධර්ම නොමැතිව නිදහස සෙවීමට ඉගැන්වීම නිසා නොකඩවා පිරිහීම වර්ධනය වෙමින් ජාතියක් වශයෙන් අපි වේගයෙන් පහතට වැටී ලිස්සා යනවා පෙනෙන්නේය.

එම අවස්ථාවේදීම ත්‍රස්තවාදය නිරන්තරයෙන් අඛණ්ඩව තර්ජනයක්ව පවතී. එමෙන්ම අහංකාර විවාදයන් අපගේ අනාගත ආර්ථිකයට තර්ජනයක් පමණක් නොව නමුත් අපගේ දරු මුනුපුරන්ට අනතුරුදායක තර්ජනයක් වී තිබේ. මෙහිදී අපගේ ප්‍රේමණීය ජාතියට සිදුවන්නට යන්නේ කුමක්දැයි කියා අපි සාක්ෂි කාරයන් වශයෙන් කාරනා දෙකක් පමණක් පැහැදිලි කරන්නෙමු. ක්‍රිස්තුස් වහන්සේත් පොළොව විනිශ්චය කිරීමට නැවත පැමිණෙන්නාවූ අවසාන කාලයේ දින දර්ශනයේ අවසාන කෙළවර සහ උන්වහන්සේගේ රාජ්‍යය පොළවේ පිහිටුවීමේ සීමාවේ අපි සිටිනවා හෝ දෙවියන් වහන්සේගේ උදහස අපි දරා සිටිනවා වන්නෙමු. එමඟින් පුද්ගලිකව හෝ සමාජයක් වශයෙන් ඔවුන් දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රතිඵලය අත්දැකීමට උන්වහන්සේ ඉඩ හැර තිබෙන සේක. බොහෝ මනුෂ්‍යයන් බයිබලීය සත්‍යතාවයක් අයින් කර දමා වෙනත් දේවලට ඉඩහැර ඇත.

කෙසේ වෙතත් එවැනි විනිශ්චයන් වල දී දෙවියන් වහන්සේගේ සභාව පසුතැවිලි වෙමින් සහ යටහත් වෙමින් දෙවියන් වහන්සේ වෙතට හැරී එන විට පිබිදීමට දොරටු විවෘත වන්නේ ය. ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීම අපගේ අත් වලින් පිටත තිබෙන නමුත් පිබිදීම සහ සමාජයීය සංස්කෘතිකමය ප්‍රයෝජන වඩා වැඩි වශයෙන් අපගේ දෑත් මත තිබෙන්නේය. හැදියාව මරණයට පත්වූ කුමන්ත්‍රණකාරී න් අනපේක්ෂිත ලෙස සභාවට පැමිණ තිබෙන විටදී වුවත් පසුතැවිලි වී දෙවියන් වහන්සේ වෙතට හැරෙන විට හැරෙනවිට සංස්කෘතික හැදියාව එකගතාවයකට එළැඹීමට බලය ලබා දෙන සේක. දෙවියන් වහන්සේ සහ උන් උන්වහන්සේගේ නියෝග ඇමරිකාවේ (ඔබගේ දේශයේ වුවත්) එකම බලාපොරොත්තු වන්නේ ය. එම බලාපොරොත්තුව ඉටු කර ගැනීම සඳහා සභාව උන්වහන්සේගේ උන් වහන්සේගේ ආධිපත්‍ය යටතේ පවතින විට පමණක් උන්වහන්සේගේ රාජ්‍යයේ යතුර අපට ලබා දෙන සේක.

දෙවියන් වහන්සේ වෙතින් ඈත්ව සිටීම

වර්තමානයේ දී අපේ රටේ ප්‍රශ්නය වී තිබෙන්නේ එය පමණක් නොව දෙවියන් වහන්සේට සමීප නොවී සිටීම තවත් ගැටලුවකි. අපි සෙනඟක් වශයෙන් ඉතා ඉක්මනින් දෙවියන් වහන්සේගෙන් ඈත්ව සිටීම වෙතින් දෙවියන් වහන්සේ වෙතට හැරී උන් වහන්සේට සමීප විය යුතුය. උන්වහන්සේ තුළ සිට අනිත් කාරණා දෙස බැලිය යුතුය. මක්නිසාද ඇමරිකාව (ඔබගේ දේශයේ සෙනඟ) දෙවියන් වහන්සේ වෙතින් ඈත්ව සිටීම ගැන යටත් වීමේ තීරණය ගැනීම හෝ නොගැනීම මත දෙවියන් වහන්සේගේ උදහස ක්‍රියාත්මක වීම හෝ නොවීම සිදුවේ.

අපගේ ජාතිය රෝගී වී සිටින්නේ නිකම්ම නොව දූෂිත වූ දේශපාලඥයන්, ත්‍රස්තවාදීන් හෝ අන්තවාදීන් නිසාය. අපගේ ප්‍රශ්න වලින් පැහැදිලිවම අනාවරණය වන්නේ කිතුනුවන්ගේ අසාර්ථකත්වයයි. හවුල්කරුවන්ගේ පාපයවත්, ඔවුන් කරන්නට අපේක්ෂා කරන්නා වූ දේවල් වත් විශාලතම අනතුර නොවේ. මනුෂ්‍ය උපත ලබන විට දීම පව් කරුවන් ලෙස උපත ලබා අපරාධ තුළ හැඩගැසී ඇත. (ගීතාවලිය 51:5, එපීස 2:1-3) සැබෑ අනතුර නම් සභාව දෙවියන් වහන්සේගේ රාජ්‍යය පතල කිරීමෙහි දී අසාර්ථක වීම සහ අපගේ ලෝකය සහ ජාතිය උදෙසා යහපත් බලපෑමක් ඇති කිරීම සමාජයීය නියමයන් මත කිරීමට උත්සාහ දැරීමයි .

අපගේ ජාතිය තුළින් අනාවරණය වන පූර්ව ලක්ෂණ භෞතික, සාමාජීය, ආර්ථික වර්ගවාදී සහ අනෙකුත් කාරණා බවට පත් ව තිබුණත් අද දවසේ ඔවුන් අර්බුද වල් ආවේගය පසෙක දමා ආත්මික බව මත පැවතිය යුතු ව ඇත. සමහර අය යන්තමින් පල දරති. අපි සභාවේ පංගුකාරයන් වශයෙන් සැබෑ ලෙස දෙවියන් වහන්සේ වෙතට හැරී නොකඩවා උන්වහන්සේ තුළ පවතින තෙක්, අපි උන්වහන්සේ ගේ හඬට ඇහුම්කන් දෙන තෙක්, අපි යටහත් වී නිරාහාරව යාච්ඤා කරන තෙක් අපි එක්ව උන්වහන්සේගේ මුහුණ සොයන තෙක් විසඳුම දකින්නේ නැත. අපේ ජාතියේ අර්බුද වලට ප්‍රථම සහ වැදගත්ම විසඳුම ජනාධිපති නිල නිවසින් බලා නොසිටිය යුතුය. අපගේ අර්බුද වලට ප්‍රථම සහ වැදගත් විසඳුම දෙවියන් වහන්සේගේ ගෘහයෙන් සෙවිය යුතුය. මක්නිසාද දෙවියන් වහන්සේ අපව සම්පූර්ණයෙන්ම රැකබලා ගන්නා සේක. උන් වහන්සේගේ සෙනඟ, උන් වහන්සේට සමීපවීමට ප්‍රමුඛතාවය දිය යුතුය.

කාලය දැන්ය

කිතුනුවන් ලෙස අපගේ දේශයේ ඉරණම අපගේ දෑත් සහ අපගේ හදවත් මත රැඳී පවතින්නේ ය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ විසඳුමේ පියවර සගවා තබන්නේ නැත. උන්වහන්සේ නිහඬව නොසිටින සේක. අපගේ දේශය තුළ ඇති බොහෝ විනාශකාරී ස්වභාවයන් නිසා අපි මුහුණ දෙන්නා දෙන්නාවූ සියලු දේ පිරිහීමට සහ විනාසයට විනාශයට ලක් වී පවතින්නේ ය. සාමූහිකව එකට එකතු වී ස්වාමීන් වහන්සේව සෙවීමට කාලය තව ම පැමිණ නැද්ද ? දැන් එක් රැස්වීමට කැඳවිය යුතු කාලය නොවේද ?

2 ලේකම් 15: වන පරිච්ඡේදයේ අපගේ ජාතිය මේ මොහොතේ දී වෙනස් විය යුතු කෙසේදැයි පෙන්වා දෙන්නා වූ ඉතා වැදගත් සම්පූර්ණ උදාහරණයක් සඳහන් වෙයි. ***"බොහෝ විනාශයන් සිදු වීමට පෙර සාක්ෂිකරුවන් ලෙස අපි දෙවියන් වහන්සේ ඉදිරියේ දණින් වැටෙමු." බොහෝ කාලයක සිට ඊශ්‍රායෙල්වරු සැබෑ වූ දෙවියන් වහන්සේ ද, උගන්වන පූජකයෙක් ද, ව්‍යවස්ථාව ද, නැති ව සිටියෝ ය ."*** (2 ලේකම් 15 ; 3) ***" ඒ කාලවලදී පිටතට ගිය කෙනෙකුටවත්, ඇතුළට ආ කෙනෙකුටවත් කිසි සමාදානයක් නැතිව දේශ වල සියලු වැසියන්ට මහත් පීඩා පැමිණියෝය . ජාතියක් කරුණු කොටගෙන ජාතියක් ද, නුවරක් කරුණු කොටගෙන නුවරත් ද, පොඩි කරනු ලැබුවේය. මක්නිසාද, දෙවියන් වහන්සේ සියලු ආකාර විපත්ති වලින් ඔවුන් පෙලූ සේක "*** (2 ලේකම් 15 5-6) වැරැද්ද කුමක්ද? ඊශ්‍රායල් ජනතාවගේ ජීවිත වල තීරණාත්මක කාරණා තුනක් මගහැර ගෙන තිබුණි. එම කාරණා තුනම වර්තමානයේ ඇමරිකාව ද (අපගේ රටේද) මගහැර ගෙන තිබේ. කෙටියෙන් පවසන්නේ නම් මගහැර ගෙන තිබෙන්නා වූ පළමු කාරණය වන්නේ "සැබෑ දෙවියන් වහන්සේව" වන්නෝය

ඉශ්‍රායෙල් සෙනඟ අදේවවාදීන් ලෙස හෝ බොහෝ කාලයක් තිස්සේ දෙවියන් වහන්සේව විශ්වාස නොකළා යැයි ලේකම් පොතේ කතුවරයා පවසන්නේ නැත. ඔවුන් දේව මාලිගාවට පැමිණියේ නැතැයි කියාද පවසා නැත. දේව මාලිගාවේ පූජාසනයේ පූජාව ඒ වන විටත් දැල්වෙමින් පැවතුණි. නමුත්

5 පිටුවට

යටහත්වීමට, පසුතැවිලිවීමට සහ යාච්ඤා කිරීමට කැඳවනු ලබන සේක.

ඊව් කාමිවෙල් විසිනි

ඔටළු රැළක් මෙන් යෝසෙප් ගෙන ගෙනයන්නාවූ ඊශ්‍රායල් ගේ එඬේරාණෙනි, කන් දුන මැනව. තෙරුබිම් පිට වැඩ හිඳින තැනැත් වහන්ස බැබැලුව මැනව. එප්‍රායිම් ද, බෙන්ජමින් ද, මනස්සේ ද, ඉදිරියෙහි ඔබගේ බලය පාමින් අප ගළවන පිණිස වැඩිය මැනව. දෙවියන් වහන්ස අප නැවත හැරෙව්ව මැනව. ඔබගේ මුහුණ බැබලෙව්ව මැනව. එවිට අපි ගැලවෙන්නේමුව. සේනා වල දෙවි වූ ස්වාමීන් වහන්ස, ඔබගේ සෙනඟගේ යාඥාවට විරුද්ධව කොපමණ කල් උදහස් ව සිටින සේක් ද? ඔබ කඳුළු නැමැති කෑම ඔවුන්ට කෑවු සේක. බොහෝ කොට කඳුළු පෙවූ සේක. අපේ අසල්වාසීන්ට අප දිනරයට හේතුවක් වෙන්නට ඔබ සලස්වන සේක. අපේ සතුරෝ ඔවුනොවුන් අතරේ සිනාසෙති. සේනා වල දෙවියන් වහන්ස අප නැවත හැරෙව්ව මැනැව. ඔබගේ මුහුණ බැබලෙව්ව මැනව. එවිට අපි ගැලවෙන්නෙමුව. (ගීතාවලිය 80: 1-7)

එවිට අපි ඔබකෙරෙන් ආපසු නොයන්නෙමුව. අප ජීවත් කළ මැනැව. අපි ද, ඔබගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමුව. සේනා වල දෙවි වූ ස්වාමීන් වහන්ස නැවත හැරෙව්ව මැනව. ඔබගේ මුහුණ බැබලෙව්ව මැනව. එවිට අපි ගැළවන්නෙමුව (ගීතාවලිය 80:18-19)

ගීතාවලිය 80 වන ගීතිකාව මත රිචඩ් ඕවන් රොබට්ස් දෙවියන් වහන්සේගේ ධර්මිෂ්ඨ වූ විනිශ්චය පිළිබඳ ව දේශනා කරමින් කාරණාවන් පෙන්වා දුන්නේය. එමෙන්ම ශුද්ධ ලියවිල්ලේ දෙවියන් වහන්සේගේ විනිශ්චයට හසු වීමට හේතු වුණා වූ පොදු ලක්ෂණ දෙකක පිළියම් සහ අවසානය අපට පෙන්වා දෙන සේක. විනාශ කිරීමට සහ මරණයට පත් කිරීමට දෙවියන් වහන්සේ හදිස්සි නොවූ සේක. උන්වහන්සේ ප්‍රේමණීය දයාවෙන් සහ අරුම පුදුම වූ කරුණාවෙන් පූර්ණ ව සිටින සේක. දෙවියන් වහන්සේ වැඩි කැමැත්තක් දක්වන්නේ දයාව, කරුණාව ලබා දීමට සහ විනිශ්චයට ගොදුරුකර කෙලින්ම නිරයේ ට යොමු කිරීම වෙනුවට විනිශ්චයට පිළියම් ලෙස පසුතැවිලි වීමට යොමු කිරීමට වන සේක. උන්වහන්සේගේ කරුණාව නිසා විනිශ්චයට පිළියම් ලෙස අපට උපකාරය ලබා දී අපගේ ජීවිතවල තිබෙන පාපය නිසා අපි ලබන්නට යන විපත්තියෙන් අපව ගලවා ගන්නා සේක.

රිචඩ් ඕවන් රොබට්ස් මෙලෙස පැවසුවේය. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ හිතුවක්කාර සහ උදාසීන සෙනඟ ගැන දුක් වන විට ඇතිවන්නා වූ උන්වහන්සේගේ විනිශ්චයට පිළියම් සෙවීමට උන්වහන්සේ ඔවුන්ට දක්වන්නා වූ ප්‍රේමය ප්‍රමාණවත්ව තිබෙන සේක. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ අභිමුඛත්වය ප්‍රකාශ කිරීම බැහැර කර මහත් ලෙස සෙනඟට කඳුලින් ආහාරපාන ගැනීමට සලස්වන සේක. මේ නිසා දැන් බලාපොරොත්තු බිඳ වැටීමට පුළුවන. නමුත් එය ඇත්තටම බලාපොරොත්තුව වෙතට යොමු කිරීමයි. රොබට්ස් නොකඩවා මෙසේ පවසයි." ප්‍රිය මිත්‍රවරුනි, එහිදී මැනිය නොහැකි (අප්‍රමාණ)ප්‍රතිවිපාකය කුමක්දැයි මම ඔබට ප්‍රකාශ කරන්නෙමි. අපි අවසාන විනිශ්චයට හසුවන්නේ නැත. අපි පුද්ගලිකව සහ ජාතියක් වශයෙන් දෙවියන් වහන්සේගේ විනිශ්චයට ලබාදෙන්නාවූ පිළියම් යටතේ සිටින්නෙමු. එබැවින් අපට විශ්වාස කළ නොහැකි තරම් බලාපොරොත්තුවක් ඇත්තේය. දැන් පවතින්නාවූ කාරණාවන් පැහැදිලිවම (නිශ්චිතවම) අයහපත්ව සහ ඉතා වේගයෙන් හටගන්නා වූ දුෂ්කරතාවයන් ව පවතින්නේ ය. නමුත් දෙවියන් වහන්සේට අපව නැවත හැරවීමට හැකි ව සිටින සේක. උන්වහන්සේගේ මුහුණ අප කෙරෙහි බබළවා සැබැවින්ම අප මුදා ගන්නා සේක. එය ප්‍රමාද වන්නේ නැත. "

එක් පැත්තකින් බොහෝ වේදනාවන් හට ගන්නේය. මක්නිසාද ඇමරිකා එක්සත් ජනපදයේ (අපගේ දේශයේත්) සෙනඟ දෙවියන් වහන්සේ වෙතින් සහ උන්වහන්සේගේ මාර්ග වලින් ඈත්ව ගොස් තිබේ. දෙවියන් වහන්සේ විනිශ්චය ට පිළියම් අප වෙතට ඒවා තිබෙන සේක. අපි මින් පෙර කිසිදාක නොදුටු ලෙස පුද්ගලිකවම මනුෂ්‍යයන්ගේ ජීවිත වල,පවුල් තුළ , සභාව තුළ සහ ජාතිය තුළ බිඳ වැටීම් නිසා වේදනාවන් හටගෙන ඇත. අපගේ පුද්ගලික සහ සෙනඟක් වශයෙන් පවතින්නාවූ පාපයේ ප්‍රතිඵල නෙළාගැනීමට දෙවියන් වහන්සේ ඉඩ හැර තිබෙන සේක.

නුමුත් අපව විනාශ කිරීමට දෙවියන් වහන්සේ අභිප්‍රාය කර නැත. එසේ වුවත් අපගේ ස්වභාවය අවබෝධ කර ගැනීමට අපට උපකාර කරන සේක. දෙවියන් වහන්සේගේ දයාව තුළ අපගේ පාපය ඉවසා දරා සිටීම නිසා උන්වහන්සේ අපව පසුතැවිලිවීමට මෙහෙය වන සේක. (රෝම 2: 4) උන්වහන්සේ විනිශ්චයට පිළියම් ලෙස සිදුවීමට සලස්වා තිබෙන දේවල් වලින් අපට පෙනෙන්නේ අප උදෙසා ඇති උන්වහන්සේගේ ප්‍රේමය යි. එමෙන්ම උන්වහන්සේ ගේ ආශාව අපි උන් වහන්සේ වෙතට සම්පූර්ණයෙන්ම හැරි ඒමයි. එම නිසා මෙම කාරණා තුළ විශාල බලාපොරොත්තුවක් ඇත්තේය. ආත්මික සහ සදාචාර වශයෙන් කොපමණ බිඳ වැටී තිබුණත් දෙවියන් වහන්සේට නැවත අපව ගොඩනැගීමට පුළුවන් බව අනාවරණය කර තිබෙන සේක. උන්වහන්සේගේ මුහුණ අප කෙරෙහි බබළවා අපව මුදා ගන්නා සේක.

මෙහිදී ඔබටත්, මටත් ඇති ප්‍රධාන කාර්යය වන්නේ අපගේ පාපය අවබෝධ කරගෙන උන්වහන්සේගේ මැදිහත් වීම උදෙසා උන්වහන්සේට මොරගැසීම යි. ***"සේනාවල දෙවියන් වහන්ස අප නැවත හැරෙව්ව මැනව, ඔබගේ මුහුණ බැබලෙව්ව මැනව, එවිට අපි ගැලවෙන්නෙමුව."*** (ගීතාවලිය 80 : 7) දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟ ලෙස අපට උන්වහන්සේගේ මාර්ගයේ ගමන් කිරීමට කැඳවන සේක. උදාහරණ වශයෙන් පහතින් සඳහන් වන බයිබල් පද වල දෙවියන් වහන්සේගේ සෙනඟට ඇති විනිශ්චය වෙනුවෙන් පිළියම් යොදා ඊට එකඟව කටයුතු කිරීමට කැඳවා තිබෙන ආකාරය දෙස අවධානයෙන් යුතුව බලන්න.

"වැසි නොවසින ලෙස මම අහස වසන්නේ නම්, නොහොත් රට පාළු කිරීමට පළඟැටියන් ට අණ කරන්නේ නම්, නොහොත් මාගේ සෙනඟ අතරට වසංගතය එවන්නේ නම්, මාගේ නාමය දරණ මාගේ සෙනඟ යටත්වී යාඥා කර මාගේ මුහුණ සොයා තමන්ගේ නපුරු මාර්ග අතහැරියොත් මට ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමා කොට ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි." (2 ලේකම් 7 : 13 -14)

අපගේ ජාතියේ සෙනඟගේ ප්‍රශ්න වලට පිළිතුරු ලැබෙන්නේ ජනාධිපති මන්දිරය තුළින් නොව දෙවියන් වහන්සේගේ ගෘහය තුළිනි. මක්නිසාද දෙවියන් වහන්සේගේ සම්පූර්ණ වූ නියෝගය තුළ උන්වහන්සේගේ සෙනඟ උන් වහන්සේට සමීප විය යුතුය. කිතුනුවන් ලෙස අපගේ දේශයේ ඉරණම අපගේ දෑත් සහ අපගේ හදවත් වල රඳා පවතින්නේය.

එම නිසා සහෝදර සහෝදරියනි, ප්‍රථමයෙන් අපි අපගේ ජීවිත යටත් කරගෙන යාඥාවෙන් දෙවියන් වහන්සේගේ මුහුණ සොයමින් අපගේ නපුරු මාර්ගවලින් හැරී එමු. බියෙන් හැකිලී සිටීමට හෝ අතහැර දැමීමට මෙය කාලය නොවේ. නමුත් නැවත ගොඩනැගීමට සහ උද්යෝගිමත් කිරීමට අනිත් අයව සර්වබලධාරී දෙවියන් වහන්සේ වෙතට යොමු කිරීමට කාලයයි. අපගේ ප්‍රතිචාරය පැමිණෙන තෙක් දෙවියන් වහන්සේ බලා සිටින සේක. නිවැරදි ප්‍රතිචාරය දැක්වීමට උන්වහන්සේ අපව කැඳවන සේක. මක්නිසාද උන්වහන්සේ ගේ කරුණාවෙන් විශ්වාසවන්තකමින් බලයෙන් පූර්ණ ව සිටින සේක. උන්වහන්සේ අපට ඇහුම්කන් දීමට සමාව දීමට සහ සුව කිරීමට බලා සිටින සේක. එබැවින් අපගේ පාපය ලෞකික ක්‍රම ආත්මාර්ථකාමී බව අත්හැර සම්පූර්ණයෙන්ම උන් වහන්සේ වෙතට හැරී එමු. ***"දෙවියන්වහන්සේට ළං වෙයල්ලා. එවිට උන්වහන්සේ නුඹලාට ළං වන සේක. පවුකාරයෙනි, නුඹලාගේ අත් පවිත්‍ර කර ගනිල්ලා. දෙසිත් ඇත්තෙනි, නුඹලාගේ සිත් පිරිසිදු කර ගනිල්ලා, දුක්වෙමින් වැලපෙමින් හඬා පල්ලා, නුඹලාගේ සිනාසීම ශෝකයටත් නුඹලාගේ ප්‍රීතිය කනගාටුවටත් හැරේවා, ස්වාමීන් වහන්සේ ඉදිරියෙහි පහත් වෙයල්ලා,එවිට උන්වහන්සේ නුඹලා උසස් කරන සේක."*** (යාකෝබ් 4: 8 -10)

ආත්මික ධෛර්යමත් කිරීම

ආත්මිකව සහ සංස්කෘතික ව අප වටා ඇති සියල්ල බිඳ වැටී තිබෙන නිසා පුද්ගලිකව අපි පීඩා විඳින්නෙමු. පුද්ගලිකව ඔබගේ ජීවිතයේ හෝ ඔබගේ සමීපතමයන්ගේ ජීවිත බොහෝ දුෂ්කරතාවයන් වලට හසුවී හසු වී තිබෙනවා විය හැකිය. පහතින් සඳහන් වන බයිබල් පද වලින් අපි දෙවියන් වහන්සේට මොර ගසන විට බලාපොරොත්තුව පැමිණෙන්නේ කෙසේදැයි පෙන්වාදී තිබෙන සේක. ***"ඔබ මාගේ ආත්මය සමාදානය කෙරෙන් දුරු කළ සේක. සැපත මට මතක නැති විය. මාගේ සවියන් ස්වාමීන් වහන්සේ කෙරෙන් මාගේ බලාපොරොත්තුවත් නැතිවී ගියේ යැ යි කීමි. කොසඹ සහ වසඳ, වැනි වූ මාගේ පීඩාවත් මගේ දුකත් සිහිකළ මැනව. මගේ ආත්මය තවම ඒවා සිහිකර මා තුළ පහත් වන්නේ ය. මේක මතක් කර ගන්නෙමි. එබැවින් මට බලාපොරොත්තුව ඇත්තේය අප විනාශ නොවුනේ ස්වාමීන් වහන්සේගේ කරුණාව නිසාත් උන්වහන්සේගේ අනුකම්පා වල් නොනවතින නිසාත්ය. ඒවා උදයෙන් උදය අලුත් ව තිබේ. ඔබගේ විශ්වාසකම මහත් ය. මාගේ කොටස නම් ස්වාමීන් වහන්සේ යැයි මාගේ ආත්මය කියයි. එබැවින් උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්නෙමි. ස්වාමීන් වහන්සේ ගැන බලා සිටින්නටත් උන්වහන්සේ සොයන ආත්මය ටත් උන්වහන්සේ යහපත්ය., වහන්සේගෙන් වන ගැලවීම නිශ්ශබ්ද බලා සිටීම මනුස්සයෙකුට හොඳය.*** (විලාප ගී 3 :7- 26)

"ස්වාමීන් වහන්ස, මම ගැඹුරු වළේ සිට ඔබගේ නාමය කියා යාච්ඤා කළෙමි. ඔබ මාගේ හඬ ඇසූ සේක. මගේ හුස්ම ගැනීමටත්, මාගේ හඬ ගැසීමටත් ඔබගේ කන වසා නොගත මැනව. මා ඔබට යාච්ඤා කළ දවසේදී ඔබ ළංවී ඔය නොවන්නැයි කීසේක." (විලාප ගී 3: 55-57)

කොපමණ දුෂ්කර අවස්ථාවල දී වුවත් ස්වාමීන්වහන්සේ තුළ නිරතුරු ව ම බලාපොරොත්තුව ඇත්තේය. උන්වහන්සේ බලයෙන් පූර්ණ වූ, ඉවසිලිවන්ත වූ දෙවියන් වහන්සේ නිසා සීමාවක් නොමැතිව ම අපව මුදා ගෙන සුව කර, නිදහස් කර, නැවත ගොඩනඟා, නැවත අලුත් කර, උද්යෝගිමත් කර, සමාව ලබාදී, මග පෙන්වමින්, සැනසිල්ල, ධෛර්ය ලබා දී ශක්තිය සැපයීම, දොරටු විවෘත කිරීම සහ ප්‍රඥාව ලබා දීමට ක්‍රියා කරන සේක. දෙවියන් වහන්සේට කිසිවක් අපහසු නැත (යෙරමියා 32 -17) දෙවියන් වහන්සේ ඔබ ගැන සලකන බැවින් උන්වහන්සේ වෙත ඔබගේ අවධානය යොමු කරන්න. (1 පේත්‍රුස් 5:7)

"ස්වාමීන් කෙරෙහි බලා සිටින සියල්ලෙනි, ශක්තිමත් වී නොපගේ සිත ධෛර්යවත් වේවා. "
(ගීතාවලිය 31 : 24)

"ඔබ දේශය කම්පා කරවූ සේක. එය ඉරා දැමූ සේක. ඒකෙ බිදුම් පිළියම් කළ මැනව මක්නිසාද එය සෙලවෙයි. (ගීතාවලිය 60: 2)

විනිශ්චයට පිළියම් ලෙස පසුතැවිලි වී යාච්ඤා කිරීමට කැඳවනු ලබන සේක.

ඩේවිඩ් ආර් රේගන් විසිනි

දෙවියන් වහන්සේ මනුෂ්‍යයන් සමග කටයුතු කර තිබෙන ආකාරය බයිබලයේ සහ ඉතිහාසය යන දෙක තුළම තහවුරු කර තිබේ. සියල්ලට ප්‍රථමයෙන් මනුෂ්‍යයාට බලාපොරොත්තුවක් ලබාදීමට දෙවියන් වහන්සේ කටයුතු කරමින් ඔවුන්ගේ සීමාවන් පිළියෙල කිරීම සහ ඔවුන්ට අරමුණක් (අභිප්‍රායක්) ලබාදීම ගැන බයිබලයේ සඳහන් වේ. සෙනග දෙවියන් වහන්සේට විරුද්ධ ව කැරලි කාරයන්ව සිටින විට ප්‍රථමයෙන් දෙවියන් වහන්සේ අනාගතවක්තෘ ව පාවිච්චි කරමින් සෙනඟව පසුතැවිලිවීමට කැඳවනු ලැබූ සේක. අනාගත වක්තෘවරු මනුෂ්‍යයන්ගේ අවධානය දෙවියන් වහන්සේ වෙතට යොමුකර දෙවියන් වහන්සේගේ සදාචාරමය නියමයන් කඩ කිරීම පිළිබඳ විවෘත ව ප්‍රකාශ කරන්නේය. අනාගත වක්තෘවරුන්ට අනාගතය පිළිබඳ අස්වාභාවික දැනුමක් නොමැති නමුත් දෙවියන් වහන්සේගේ වචනය කරුණු කොටගෙන සිදුවන්නට යන්නේ කුමක්දැයි දැන සිටිති. ජාතීන් සමඟ නිශ්චිත සැලැස්මකට අනුව දෙවියන් වහන්සේ කටයුතු කරන බව අනාගත වක්තෘවරු දනිති. පසුතැවිලි වී හැරීමට ජාතීන් කටයුතු නොකරන විට ඔවුන් සමග කටයුතු කිරීම ට දෙවියන් වහන්සේ දැන සිටින සේක.

මනුෂ්‍යයන් පසුතැවිලි වීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඊට පිළියම් ලෙස දෙවියන් වහන්සේ විනිශ්චය එවන සේක. උන්වහන්සේ එකකට පසුව තව එකක් වශයෙන් දිගටම විනිශ්චයන් එවන සේක. මෙම විනිශ්චයන් විවිධ ආකාරයෙන් වීමට පුළුවන. එය ආර්ථික විපත්තියක්, හමුදාමය පරාජයක්, කාලගුණික විපර්යාසයක්, වසංගත රෝගී තත්ත්වයක් ආදී විය හැකිය. මේ ඕනෑම ආකාරයකින් දෙවියන් වහන්සේ විනිශ්චයේ පිළියම් එවන සේක. අවසානයේ දී දිගින් දිගටම දෙවියන් වහන්සේට විරුද්ධ ව චෝදනා කරමින් පසුතැවිලි වීම ප්‍රතික්ෂේප කරන්නේ නම් විනාශවීමේ විනිශ්චය පැමිණීමට ඉඩ හරින සේක. දෙවියන් වහන්සේගේ විනිශ්චය පැමිණෙන විට සුව කළ නොහැකි වසංගත රෝග පැමිණි බව බයිබලයෙ නැවත නැවත ඉතා විශේෂ ලෙස සඳහන් කර තිබේ . සියලු අනාගත වක්තෘවරු පැමිණ පණිවිඩය ප්‍රකාශ කිරීම කරුණු කොට ගෙනත් නොහැරෙන විටදී මෙම තත්ත්වයන් හටගන්නේය. සුව කළ නොහැකි වේදනාවන් පැමිණෙන විට දෙවියන් වහන්සේ විනාශයේ විනිශ්චය කරුණු කොටගෙන ජාතින් අතරේ විනිශ්චය කටයුතු සිදු කරන සේක.

2011 සැප්තැම්බර් මාසයේ එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය තුළ ප්‍රකාශය වූ විනිශ්චය

මම කතා කරන්නා වූ දේ පිළිබඳව අපේ ජාතියට ඉතා හොඳ උදාහරණයක් ඇත්තේය. යුදා ජාතියට හැර වෙනත් ජාතියකට අපට මෙන් ආශිර්වාදයක් ලබා දී නොමැත. ඇමෙරිකාවට පමණක් යුද සෙනඟට මෙන් දෙවියන් වහන්සේ ආශිර්වාද කර තිබෙන සේක. ඒ අතරම 1960 දශකයේ ප්‍රවේසමින් ඉදිරියට යා යුතු බව දෙවියන් වහන්සේ සංඥා කළ සේක. සංස්කෘතික විප්ලවය ආරම්භ වීම සහ ලිංගික අසංවර කම් නැමැති වලට වේගයෙන් ඇදවැටීම, මත්ද්‍රව්‍ය අපචාරවලට ලක්වීම, ගබ්සා කිරීම් ඉතා බහුල වීම, මුදලට සුදු ක්‍රීඩාවල යෙදීමට නීතියෙන් අවසර ලබාදීම, ආගමික පූජනීය දේවල් අවමානයට ලක් කිරීම අසීමිත ලෙස ව්‍යාප්ත වීම, ජල ගැල්මක් මෙන් අසභ්‍ය නිර්මාණ බිහි කිරීම වැනි කාරණා වේගයෙන් වර්ධනය වීමට පටන් ගත්තේය. තමාගේ සැපත ගැන සොයන්නා වූ ජීවන රටාවක් අපගේ ජාතිය හරහා වේගයෙන් හමා යාම සහ අවසානයේ දී යහපත නපුර ලෙසත්, නපුර යහපත ලෙසත් ලෙස ප්‍රකාශ කිරීමට අපි පැමිණීම සිදුවූයේය.

දෙවියන් වහන්සේ අනාගත වක්තෘවරු න්ව එවමින් පසුතැවිලිවීමට කැඳවනු ලැබූ සේක. ඒ අතරෙන් ඩේවිඩ් විල්ක්සන් ගේ හඬ ඉතා වැදගත් වූයේ ය. ඔහු නිව්යෝර්ක් නගරයේ පිහිටි සභාවක සභා පාලකවරයා විය. 1970 දශකයේ මුල් කාලයේ දී ඔහු සෙනඟව අමතමින් බලවත් ලෙස කරන්නා වූ පාපය ගැන පසුතැවිලි වී දෙවියන් වහන්සේ වෙතට හැරෙන්නේ නැතිනම් එකකට පසු එකක් ලෙස දෙවියන් වහන්සේගේ විනිශ්චය පැමිණෙන බව ප්‍රකාශ කළේය. ඔහුට අනාගතය පිළිබඳ අස්වාභාවික දැක්මක් තිබුණේ නැත. දෙවියන් වහන්සේගේ වචනය පිළිබඳ හොඳ අවබෝධයකින් සිටියේය. සෙනඟ දෙවියන් වහන්සේට විරුද්ධ ව කැරලි ගසමින් විනිශ්චය වෙතට පැමිණෙන බව ඔහු දැන සිටියේය.

මනුෂ්‍යයන් අනාගතවාක්‍යයේ හඬ නොසලකා හරින විට දෙවියන් වහන්සේ ප්‍රතිචාරය දක්වමින් ඊට විනිශ්චයේ පිළියමක් ලෙස වියට්නාම් යුද්ධය එවනු ලැබූ සේක. ඒඩ්ස් වසංගතය ලිංගික රෝග වසංගතයක් ලෙස පැතිර යාම සහ සමලිංගික රෝග වසංගත ලෙස පැතිර යාම සිදුවිය. දෙවියන් වහන්සේ ස්වභාවික විපත් වන භූමි කම්පා, ගංවතුර ටොනාඩෝ(සුලි කුණාටු) සහ විශ්වාස කළ නොහැකි ලෙස යමහල් පිපිරී යාම් වලිනුත් අපගේ ජාතියට දඬුවම් කළ සේක.

මෙම සියලු විනිශ්චයන් අවසානයේදී 2011 සැප්තැම්බර් ත්‍රස්තවාදී ප්‍රහාරය පැමිණි බව මම විශ්වාස කරමි.ජාතියේ දුරාචාරයන් ගැන බලපත් ලෙස පසුතැවිලි වීමට කැඳවූ බව මම විශ්වාස කරමි. සෝවියට් දේශය ටත් වඩා ඇමරිකා එක්සත් ජනපදය සදාචාරය දූෂණය කිරීම පිළිබඳව මුළු ලෝකයට තර්ජනයක් වී ඇති බව සිතීම ඔබ නතර කර තිබෙනවාද ? ලෝකයේ කොතැනක හෝ සිට ඔබ රූපවාහිනිය දෙසට හැරුණු විට බොහෝ දුරාචාරය සහ ප්‍රචණ්ඩත්වය සහිත ඇමරිකන් චිත්‍රපට සහ රූපවාහිනී වැඩසටහන් දැකිය හැකිය. පොළවේ දූෂණය වී තිබෙන සදාචාරය සඳහා අපි වගකීමෙන් යුතුව කටයුතු කිරීම දෙවියන් වහන්සේට අවශ්‍යව තිබෙන සේක.

2011 සැප්තැම්බර් මාසයේ ලෝක වෙළඳපොළට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය අනපේක්ෂිත සිදුවීමක් ලෙස මම නොසිතමි. එයින් ඇමරිකාවේ උඩඟුකම දෙයාකාරයකින් සංකේත වූයේය. මුදල් සහ බලය යනු උඩඟුකම් දෙකටම ප්‍රහාරය එල්ල විය. දෙවියන් වහන්සේ අපව අවදි කර උන් වහන්සේ වෙතට කැඳවන බව හඟවා දුන්සේක. අවසනාවන්ත ලෙස අප නින්දේ පසු වෙන්නාක් මෙන් සහ අවදිවීමේ සංඥාව විසන්ධි කර නැවත කෙටි නින්දකට පත් ව සිටින්නෙමු. 2011 සැප්තැම්බර් ප්‍රහාරයට පසුව ඉතා ඉක්මනින් අපි නැවත ආධ්‍යාත්මික නින්දට හැරී ගොස් ඇත.

ඊශ්‍රායලයට ආවේණික කාරණා

ඇමරිකාව මත ඊශ්‍රායලයට මෙන් දැන් පිළියමේ විනිශ්චයන් ඇති වී තිබෙන බව මම විශ්වාස කරමි. 1990 ට පෙර ඊශ්‍රායල් ට අපි නරක විදියට සලකනු ලැබූ වෙමු. ඊශ්‍රායල් සෙනඟට නරක විදිහට සැලකීම නිසා අපි අසාර්ථකව 1991 සිට විනිශ්චයට ලක්වී ඇති බව අත්දැකීමෙන් අවබෝධ කර ගන්නෙමු . මේ පිළිබඳව ඉතා වැදගත් කාරණා දෙකක් බයිබලේ අපට පවසා තිබේ. ***"නවද, නුඹට ආශිර්වාද, කරන්නන්ට මම ආශිර්වාද, කරන්නෙමි. නුඹට ශාප කරන්නට මම ශාප කරන්නෙමි. පොළොවේ සියලු පවුල් නුඹ කරුණු කොට ගෙන ආශිර්වාද, ලබන්නෝ ය යි කී සේක"*** (උප්පත්ති 12:3) මෙය ආබ්‍රහම් සමග දෙවියන් වහන්සේ ඇතිකරගත් සදාකාල ගිවිසුමේ කොටසකි. යුදෙව් සෙනඟට ආශිර්වාද කරන්නන්ට මම ආශීර්වාද කරන්නෙමි. ඔවුන්ට සාප කරන්නන්ට මම ශාප කරන්නෙමි. ***"..... මක්නිසාද, නුඹලාට අත ගසන්නා උන්වහන්සේගේ ඇසේ කළු ඉංගිරියාව ට අත ගසන්නේය. "*** (සෙකරියා 2:8) මෙය ඉතා ගැඹුරු වූ ප්‍රකාශයකි. ඉතිහාසය මෙම සත්‍යතාවය ට සාක්ෂි දරයි.

කාලගුණික පණිවිඩය

තවත් පණිවිඩයක මාතෘකාව වන්නේ දෙවියන් වහන්සේගේ විනිශ්චය සහ කාලගුණයයි. දෙවියන් වහන්සේ සහ කාලගුණය පිළිබඳව බයිබලයේ පවසා තිබෙන දේ මම ගැඹුරින් සොයා බැලුවෙමි. එක් කාරණයක් නම් ස්වභාවික ලකුණුවලින් දෙවියන් වහන්සේ නිතරම කතා කර තිබෙන බව සහ ඉතිහාසයෙදි සෑම තැනම මූලික ක්‍රියා මාර්ග දෙකකින් ස්වභාවික ලකුණු භාවිතා කර තිබෙන බවයි. ප්‍රථමයෙන් දෙවියන් වහන්සේ ස්වභාවික ලකුණු භාවිතා කර ඉතා බරපතළ මහත් වූ කාරණා අවබෝධ කර දී තිබෙන සේක. එලෙස උන්වහන්සේගේ ක්‍රියා කිරීම පිළිබඳව උදාහරණයක් වශයෙන් යේසුස් වහන්සේගේ උපත සිදු වන විට ස්වර්ගයෙන් විශේෂ ආලෝකයක් විහිද වූ සේක. (පෙරදිගින් පැමිණි රජවරු දුටුවා වූ අහසේ පායා තිබූ තරුව) සහ යේසුස් වහන්සේගේ කුරුසපත් වීමේදී පැය තුනක් අන්ධකාර ව පැවතීම සහ භූමිකම්පාව පෙන්වා දිය හැකිය.

මා ප්‍රකාශ කරන්නා වූ තවත් කාරණයක් නම් දෙවියන් වහන්සේ ස්වභාවික ලකුණු ඉතා බහුලව භාවිත කර ඇති බවයි. පාපයට පිළියමක් ලෙස විනිශ්චය ගෙන එන විට ජාතික පසුතැවිලිවීමට කැඳවීම සඳහා දෙවියන් වහන්සේ ස්වභාවික ලකුණු භාවිතා කර තිබෙන සේක. දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සිංහාසනය සිට විනිශ්චය ලෙස කාලගුණය පාවිච්චි කරමින් පණිවිඩය ලබා දෙන බව මම විශ්වාස කරමි. දෙවියන් වහන්සේගේ පාලනය තුළ එය පවතින්නේ ය. උන්වහන්සේට සරදම් කරන්නට කිසිවෙකුට නුපුළුවන. දෙවියන් වහන්සේගේ ශුද්ධවූ දේශය බෙදීමට උන්වහන්සේ ඉඩ නාරින සේක. පිළිකුල් සහගත දුරාචාරයට සරදම් කිරීමට උන්වහන්සේ ඉඩ නාරින සේක. ශිෂ්ට සම්පන්න සදාචාරය සෑම විටම ඇති කරන සේක.

දෙවියන් වහන්සේ අපේ ජාතියට ප්‍රේම කරන සේක. අනිත් සෑම ජාතියකටම වඩා අපේ ජාතියට උන්වහන්සේ ආශිර්වාද කර තිබෙන සේක. නමුත් දෙවියන් වහන්සේගේ වචනයේ පවසන්නේ වැඩියෙන් ලබා දුන්නා වූ අයගෙන් වැඩියෙන් අයකරගන්නා බවයි. එමෙන්ම දෙවියන් වහන්සේ ප්‍රේම කරන්නන් ව උන්වහන්සේ හික්මවන බවද දේව වචනය සඳහන්ව තිබේ. දෙවියන් වහන්සේ හික්මවනු ලබන විට මූලික අභිප්‍රාය දඬුවම් කිරීම නොවන බවත් දේව වචනයේ පැහැදිලිව සඳහන් වේ. දෙවියන් වහන්සේගේ මූලික අරමුණ අපව පසුතැවිලිවීමට කැඳවීම නිසා මහත් ලෙස අපව මුදා ගන්නා සේක. යෙසායා 26 :9 යන පදයේ මෙම ක්‍රියාමාර්ගය සඳහන් කර තිබෙන සේක. ***"මාගේ ආත්මයෙන් මම රාත්‍රියෙහි ඔබ කෙරෙහි ආශා වීමි. එසේය, මා තුළ, මගේ ආත්මයෙන් අළුයම ඔබ සොයන්නෙමි. මක්නිසාද, ඔබගේ විනිශ්චයන් පොළොවේ ඇති කල්හි ලෝවැසි ලෝ ධර්මිෂ්ඨකම ඉගෙන ගනිති."*** (යෙසායා 26 :9)

ඒබ්‍රහම් ලින්කන්ගේ අවබෝධ කර ගැනීම

නිල රාජකාරියක් නොවුනත් ඇමරිකාවේ සිවිල් යුද සමයේ දී ඒබ්‍රහම් ලින්කන් අපගේ ඉතිහාසයේ ආත්මික විනාශ වීම ඇගයීමක් කර පැහැදිලිව පෙන්වා දුන්නේය. 1863 මාර්තු 30 වෙනිදා ජාතික දිනයේ දී ජනාධිපතිවරයා මුළු සෙනඟට පසුතැවිලි වී යාච්ඤා කිරීමට කැඳවීමේ නිවේදනයක් නිකුත් කළේය. ලින්කන් ඔහුගේ මතය මෙසේ ප්‍රකාශ කළේය. දෙවියන් වහන්සේගේ දිව්‍යමය නියමය අපි හොඳින් අවබෝධ කර ගන්නෙමු. පුද්ගලිකව මෙන්ම, ලෝකයක් ලෙසත් දෙවියන් වහන්සේගේ දඬුවම් කිරීම සහ හික්මවීම පිළිබඳව අපි අවබෝධ කරගෙන සිටින්නෙමු. සිවිල් යුද්ධයේ භයානක ව්‍යසනයට අපි භය වීම සුදුසු නොවේ. දැන් තිබෙන්නේ විනාශයට පත් වූ දේශයක් විය හැකිය. නමුත් අප මත තිබෙන දඬුවම පරාජය කිරීම සඳහා සීමාව ඉක්මවා ගොස් තිබෙන අපගේ පාපය අවසන් කර ජාතියක් ලෙස නැවත හැඩ ගැසිය යුතුය."

ලින්කන් නොකඩවා මෙසේ පැවසුවේය. "අපව තෝරා ගැනීම උදෙසා අපි ස්වර්ගීය කරුණාව ලබා ඇත්තෙමු. බොහෝ කාලයක් සමාදානය සහ සපලත්වය තුල අපව ආරක්ෂා කර තිබෙන සේක. අනිත් කිසිදු ජාතියකට නොමැති ලෙස බලයෙන් සුවයෙන්, ශක්තියෙන්, ගණනින් අපව වර්ධනය කර තිබෙන සේක. " ලින්කන් ඊට තවත් එකතු කරමින්, නමුත් අපි දෙවියන් වහන්සේව අමතක කර ඇත්තෙමු . අපට දී තිබෙන්නා වූ තිබෙන්නාවූ කරුනාවේ හස්තයේ ආරක්ෂාව තුළ ඇති සමාදානය ජයග්‍රහණය වර්ධනය පොහොසත්කම ශක්තිය අපි අමතක කර දමා ඇත්තෙමු . මෙයට ඇහුම්කන් දෙන්න අපි සිතින් මවාගන්නා වූ නිශ්ඵල දේවල් නිසා අපගේ ආශිර්වාදය කරණ කොටගෙන නිපදවන්නා වූ දේවල් අපගේ දැහැමි බව සහ ප්‍රඥාවේ විශේෂත්වය නිසා ඇතිවී තිබෙන්නේ යැයි අපගේ හදවත් මුලා කර ගෙන ඇත.

ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් මෙම වචන සමග ඔහුගේ කතාව අවසන් කළේය. අඛණ්ඩ සාර්ථකත්වය සමග උද්දමයට පත් වීමෙන් අපි බොහෝ අහංකාරකමට පත්ව සිටින නිසා උඩඟුකමින් යුතුව දෙවියන් වහන්සේට යාඥා කිරීමෙන් මිදීම සහ කරුණාවේ ආරක්ෂාව ලබා ගැනීමත්, අපගේ ජීවිත යටහත් කරගෙන අපගේ සෙනඟගේ පාපය ගැන පසුතැවිලි වී යාච්ඤා කිරීමට අනුකම්පාව සහ සමාව ලබා ගැනීමත් අවශ්‍ය ව තිබේ. අපේ රටේ සෙනඟ දෙවියන් වහන්සේට විරුද්ධව කොඳුරමින් සිටිති. එසේ නොවී විනාශයේ විනිශ්චයෙන් අප ඉවත් කරන ලෙස මොරගසමින් යාච්ඤා කරමු.දෙවියන් වහන්සේ දයාවෙන් පූර්ණ ව සිටින සේක. අවදි වන පිණිස නැවත නැවත අප කැඳවන සේක. එම නිසා පසුතැවිලි වෙමින් යාඥාවේ යෙදී සිටිමු.

"මක්නිසාද වරක් නුඹලා අන්ධකාර ව සිටිය නමුත් දැන් ස්වාමීන්වහන්සේ තුළ ආලෝක ව සිටින්නාහුය ..." (එපීස 5: 8)

යේසුස් වහන්සේ නිතරම යාච්ඤා කළ සේක.

මෙම කාරණය නැවත වාරයක් පෙන්වා පෙන්වාදීමට යේසුස් වහන්සේ උපමාවක් භාවිතා කළ සේක. ***"නවද, ඔවුන් විසින් නොමැළිව නිතර යාඥා කරන්නට ඕනෑ බව දක්වන පිණිස උන් වහන්සේ ඔවුන්ට උපමාවක් කියන සේක. "*** (ලූක් 18: 1) මෙම උපමාවේ දී වැන්දඹු ස්ත්‍රිය අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා ගේ උපකාරය ලබා ගැනීමට නොකඩවා පැමිණ පැවසූ දෙයෙහි හරය මෙසේය. " යම් කෙනෙක් මට විරුද්ධ ව සිටි ඔබ එයට යුක්තිය ඉටු කරමින් ඔහුට ප්‍රතිවිපාක ලබාදීම මට දැන් අවශ්‍යව තිබේ" මෙම උපමාව මත මේ විනිශ්චකාරයාට වෙනසක් ඇති කිරීමට (යුක්තිය ඉටු කිරීමට) බලය ඇති බව අපට නිගමනය කළ හැකිය. එසේ වුවත් පිළිතුරු පැමිණීමක් පෙනුනේ නැත. මේ කාරණය උදෙසා වැන්දඹුව නිතරම විනිශ්යකාර ඉදිරියේ පෙනී සිටියේය. තිබුණා වූ මෙම වාතාවරනය (ගැටලුව) වර්ධනය වූයේය. අවසානයේදී මේ වැන්දඹුවගේ කාරණය ඉටු කිරීමට විනිශ්චකාර ඇය වෙතට හැරුණේය. ***"ඔහු කලක් නොකැමැති විය. පසුව ඔහු තමා තුළ කථා කොට මම දෙවියන් වහන්සේට බය නොවෙමි. නමුත් මනුෂ්‍යයන්ට ගරු නොකරමි. නමුත් මේ වැන්දඹුව මට කරදර කරන හෙයින් ඈ නිතර ඒ මෙන් මා නොපෙළෙන පිණිස ඇට යුක්තිය කරන්නෙමි කීයේ යැයි කී සේක. "*** (ලූක් 18:4-5)

යේසුස් වහන්සේ මෙලෙස ප්‍රකාශ කරමින් උපමාව අවසන් කළ සේක. ***"එවිට ස්වාමීන් වහන්සේ කියන සේක්. මේ අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා කියන දේ, අසා පල්ලා. දෙවියන් වහන්සේත් තමන්ට රෑ දාවල් හඬ ගසන්නා වූ තමන් තෝරාගන්න උන් ගැන යුක්තිය ඉෂ්ට නොකරන සේක්? උන් වහන්සේ ඔවුන් කෙරෙහි බොහෝ ඉවසිල්ලෙන් සිටින සේක."*** ලූක් 18: 6 -7) තවත් ආකාරයකින් පවසන්නේ නම් ඔබ දෙවියන් වහන්සේට මොර ගසන විට උන් වහන්සේ ඔබ උදෙසා සටන් කරන සේක. උන්වහන්සේ මේ අධර්මිෂ්ට විනිශ්චකාර යාමෙන් නොවන සේක. උන් වහන්සේ පසුපසට ඇදගෙන යන්නේ හෝ පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරන්නේ නැත. එසේ වුවත් ඔබ යාච්ඤා කිරීම මඟ හරින්නේ දැයි උන්වහන්සේ බලා සිටින සේක.

වර්තමානයේ බොහෝ මනුෂ්‍යයන් මේ වන විටත් ලැබී නැති දේවල් ඔවුන්ගේ හදවත් වලින් බොහෝදුරට මතක නැති කර දමා ඇතැයි මම විශ්වාස කරමි. ඔවුන් යාඥා කර තිබෙන්නේ නිශ්චිත වාතාවරණයන් උදෙසා වන්නේ ය. සමහර විට පවුලේ සාමාජිකයන් වෙනුවෙන් හෝ තමන්ගේම චරිත ලක්ෂණයක් වෙනස් වීම උදෙසා විය හැකිය. නමුත් පිළිතුරු මෙතෙක් ලැබී නැත. කෙසේ වෙතත් නියම වේලාවේදී පිළිතුරු ලැබෙන බව අපි මතක තබා ගත යුතුය. බොහෝවිට අපි සිතන්නේ අපගේ සැලැස්මට අනුව දෙවියන් වහන්සේගේ පිළිතුර ලැබිය යුතු බවයි. කෙසේ වෙතත් ස්වාමිවූ යේසුස් වහන්සේ මෙම විශේෂ උපමාව අපට ලබා දීමට හේතු වූයේ අපි ධෛර්යමත්ව යාඥාවේ රැඳී සිටීමට සහ අපගේ ඉලක්කය අත් නොහැර සිටීමට වන සේක. යේසුස් වහන්සේ මෙලෙසින් ද උපමාවට එකතු කළ සේක. ***"උන්වහන්සේ ඔවුන්ට වහාම යුක්තිය ඉෂ්ට කරන සේකැයි නුඹලාට කියමි "*** (ලූක් 18: 8) තවත් ආකාරයකින් පවසන්නේ නම් අපි යාච්ඤා කරන විට පිළිතුරු ලෙස තීන්දුව ඉක්මනින් පැමිණෙන්නේය.

දෙවියන් වහන්සේගේ පිළිතුර මෝසස් තුළින් ලබා දුන් සේක.

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට පිළිතුරු ලබාදීම පිළිබඳව බොහෝ උදාහරණ බයිබලයේ සඳහන් වේ. ඒ අතරම ඔවුන් ඒ මොහොතේ ම ඔවුන්ගේ ස්වභාවික ඇස්වලින් පිළිතුරු දුටුවේ නැත. උදාහරණයක් වශයෙන් ඉශ්රායෙල් සෙනඟ මිසරයේ වහල්කමේ සිටි කාලයේදී සිදු වූ දේ සැලකිල්ලෙන් යුතුව බලන්න. ***"ඉක්බිති කල්යාමේදී මිසරයේ රජ මළේය. ඊශ්‍රායල් පුත්‍රයෝ වහල් වැඩ නිසා සුසුම්ලමින් මොරගැසූවෝය. වහල් වැඩ නිසා ඔවුන්ගේ මොරගැසීම දෙවියන් වහන්සේ වෙතට පැමිණියෝය. දෙවියන් වහන්සේ ඔවුන්ගේ කෙඳිරි ගෑම අසා ආබ්‍රහම් සමඟ ද, ඊසාක් සමඟද, යාකොබ් සමඟද, කළා වූ තමන්ගේ ගිවිසුම සිහි කළ සේක. දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් පුත්‍රයන් බලා ඔවුන්ගේ තත්ත්වය සැලකූ සේක. "*** (නික්මයාම 2: 23-25) දෙවියන් වහන්ස අපට උපකාර කළ මැනව, සිදු වන්නේ කුමක්දැයි ඔබ වහන්සේ දකින්නේ නැද්ද? අපි ඔබගේ සෙනඟ වන්නෙමු. නමුත් අපි පීඩා විඳින්නෙමු. පරිහාසයට ලක් වන්නෙමු. සරදමට හසුව සිටින්නෙමු. පාලනයට යටත්ව සිටින්නෙමු. කියා මොර ගසමු. අපි පොළවේ ආශිර්වාදය ලද්දන් සහ අප කෙරෙහි ආශිර්වාද පැමිණෙන්නේ යැයි නොපවසන සේක් ද. එබැවින් සාමූහිකව එක්ව නිදහස් වේ යැයි සිතීමටවත් නොහැකි පීඩනයන් උදෙසා මොර ගසන්න. ශුද්ධ ලියවිල්ලේ මෙසේ සඳහන් වේ. "දෙවියන් වහන්සේ ඔවුන් පිළිගන්නා සේක. " දෙවියන් වහන්සේ ඔවුන්ව පිළිගැනීමෙන් අදහස් කරන්නේ ඔවුන් උන්වහන්සේගේ සෙනඟ බවයි. දෙවියන් වහන්සේ ඔවුන්ගේ මොරගැසීම ට පිළිතුරු ද ලබා දී තිබෙන සේක.

"නවද, ස්වාමීන් වහන්සේ කතා කොට මිසරය වසන මාගේ සෙනඟගේ පීඩාව සැබැවින්ම දුටිමි. ඔවුන්ගේ විධානවරුන් නිසා ඇති ඔවුන්ගේ මොරගැසීම ඇසීමි. මක්නිසාද, ඔවුන්ගේ දුක් දනිමි. එබැවින් මිසර වරුන්ගේ අතින් ඔවුන් නිදහස් කර ඒ රටින් පිටත් කොට යහපත් වූ විශාල දේශයකට කිරි සහ මී පැණි ගලා යන්නා වූ දේශයකට එනම් කනානිවරුන්ගේ ද, හිත්තිවරුන්ගේ ද, අමෝරිවරුන්ගේ ද, පෙරිස්සිවරුන්ගේ ද, හිව්වරුන්ගේ ද, යෙබුසිවරුන්ගේ ද, ඉඩමට පමණුවන්නට බැස්සෙමි . දැන් බලව ඊශ්‍රායල් පුත්‍රයින්ගේ මොරගැසීම මා වෙතට පැමිණ තිබේ. මිසර වරුනි කරන පීඩාවන් දුටිමි ඉතින් වරෙන්න. නුඹ මාගේ සෙනඟ වූ ඊශ්‍රායල් පුත්‍රයන් මිසරයෙන් පිටතට ගෙනෙන පිණිස මම පාරාවෝ වෙතට නුඹ යවන්නෙමි කීසේක." (නික්මයාම 3 :7- 10)

ඊශ්‍රායල් සෙනඟ මොර ගසන විට දෙවියන් වහන්සේට මිසරයේ දේශසීමාව උන්වහන්සේගේ දැත්වලින් විවෘත කිරීමට හැකිව තිබූ සේක. කිසිවක් නැති විටදී විශාල හමුදාවක් නිර්මාණය කිරීමට දෙවියන් වහන්සේට හැකියාව තිබුන සේක. එසේ නැතිනම් දේව දේවදූතයන් ඒවා රාත්‍රියේදී මිසරයේ සියලු මනුෂ්‍යයින් ව වහාම විනාශ කර දැමිය හැකිව තිබූ සේක. බොහෝ විවිධ වූ මාර්ගවලින් උන්වහන්සේට එය කළ හැකිය. නමුත් මනුෂ්‍යයන්ට වුවමනා ආකාරයට නොව දෙවියන් වහන්සේ තෝරා ගන්නා වූ ආකාරයට එය ඉටු කරන සේක. දෙවියන් වහන්සේ කාන්තාරයේ සිටියා වූ වයස අවුරුදු 80 ක මනුෂ්‍යයෙකු සොයාගෙන ඔහු කැඳවූ සේක.

දෙවියන්වහන්සේ ඊශ්‍රායල් සෙනඟගේ මොරගැසීම අසා පිළිතුරු දුන් සේක. නමුත් සෙනඟ තවමත් එය දුටුවේ නැත. මෝසෙස් නැමැති මනුෂ්‍යයා තුළින් පිළිතුරු ලබා දුන් සේක.කෙසේ වෙතත් දෙවියන් වහන්සේ ප්‍රථමයෙන් මෝසෙස් සමග කටයුතු කළ සේක. ඔහුගේ විශ්වාසය නොමැති කම මධ්‍යයේ ඔහු ව ගෙනා සේක. ඉන්පසුව මෝසස් තම මාමා වෙතට ගොස් පිටත්ව යාමට අවසර ඉල්ලුවේය. ඊළඟට ඔහු තම සහෝදරයා වූ ආරොන් වෙතට ගොස් ඔහුව පොළඹවනු ලැබුවේ ය. අවසානයේදී ඔහු තම පවුලේ අය වෙතට ගොස් මිසර ඉන් පිටත්ව යාමේ පියවර සැලසුම් කළේය. අවසානයේදී මෝසෙස් ඊශ්‍රායල් කඳවුර තුළ දී සෙනඟට ප්‍රකාශ වී ගිනි පඳුර තුළින් දෙවියන් වහන්සේ ඔහුට දර්ශනය වූ ආකාරය විස්තර කළේය. ඔහු තමාගේ සැලැස්ම ඉදිරිපත් කරමින් ආරොන් පාරාවෝ ඉදිරියේ සිට ඊශ්‍රායල් ගේ නිදහස අවධාරණයෙන් යුතුව ඉල්ලා සිටිය යුතු බව පැවසුවේය. ***"ඔව්හු ස්වාමීන් වහන්සේ ඉශ්රායෙල් පුත්‍රයන් දෙස බැලූ බව ද, තමන්ගේ පීඩාව දුටු බවද, ඇසූ කල හිස් නමා නමස්කාර කළෝය."*** (නික්මයාම 4 : 31) ඊශ්‍රායල් සෙනඟට විශ්වාසය ඇති විය.

ඔවුන් විශ්වාස කලාට පසුව වුවත් පීඩාකාරී කාරණා වර්ධනය වූයේය. නුඹලා නමස්කාර කිරීමට කාන්තාරයට යාමට ඉල්ලන්නේ නුඹලා කම්මැලි නිසා ය. කරන්නට තිබෙන වැඩ ප්‍රමාණවත් නැත. එබැවින් නුඹලාට ගඩොල් සෑදීමට පිදුරු ලබා දෙන්නේ නැත. නුඹලා පිටතට ගොස් පිදුරු සොයාගෙන ඇවිත් ගඩොල් සෑදිය යුතුය. නුඹලාට නියම වූ ගඩොල් ගණන භාර දෙන්නට ඕනෑ යැයි කියා පාරාවෝ මෝසෙස් සහ ආරොන්ට තදින්ම කියා සිටියේ ය. " (නික්මයාම 5 :7-18 බලන්න)

ඊශ්‍රායෙල් සෙනඟ මෝසෙස් සහ ආරොන්ට මෙසේ පැවසුවේය. ***"ඔව්හු ඔවුන්ට කතා කොට ස්වාමීන් වහන්සේ නුඹලා දෙස බලා විනිශ්චය කරන සේක්වා. මක්නිසාද, නුඹලා පාරාවෝ ඉදිරියෙහි ද, ඔහුගේ***

කාටර් කොන්ලන් විසිනි

සේවකයන් ඉදිරියෙහි ද, අප දුර්ගන්ධයක් වෙන්ට සලස්වා අප මරන පිණිස ඔවුන්ගේ අතට කඩුවක් දුන්නහු යැයි කීවෝය . (නික්මයාම 5 :21) ඔවුන් දෙවියන් වහන්සේට මොරගැසූ දවසේ පටන් සියලු දේ මෙසේ සිදුවිය. සැබැවින් ම දෙවියන් වහන්සේ වේගයෙන් උන්වහන්සේගේ සෙනඟට පිළිතුරු දුන් සේක. කෙසේ වෙතත් පෙනෙන්නට තිබුණේ ඉතා නරක කලින් තිබුණාටත් වඩා ගැඹුරු බලාපොරොත්තු රහිත තත්වයකි. සැබෑ වූ මහත් පිබිදීමට පෙර මනුෂ්‍යයන්ගේ ඇදහිල්ල බිඳ වැටෙන්නට පටන් ගෙන තිබුණි. මෝසෙස් වුවත් දෙවියන් වහන්සේ වෙතට පැමිණ දොස් නගන්නට පටන් ගත්තේය. ***"එවිට මෝසෙස් ස්වාමීන් වහන්සේ වෙතට හැරී ගොස් ස්වාමීනි, ඔබ මක් නිසා මේ සෙනඟට නපුර කළ සේක් ? ඔබ මා එව්වේ මන්ද, ? මක්නිසාද, මා ඔබගේ නාමයෙන් කතා කරන පිණිස පාරාවෝ වෙතට ආවායින් පසු ඔහු මේ සෙනඟට නපුර කළේය. ඔබ තමන් සෙනඟ කිසිසේත් නිදහස නොකළ සේක යි කීවේය."*** (නික්මයාම 5-22:23)

අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා සහ වැන්දඹුවගේ උපමාව අවසානයේ දී යේසුස් වහන්සේ මෙසේ පවසනවා අපට දකින්නට තිබෙන්නේ ඇයි ? ***" එසේ වී නමුත් මනුෂ්‍ය පුත්‍රයා එන කල්හි පොළවේ ඇදහිල්ල සම්බවේද, යි කී සේක"***(ලූක් 18 : 8)දෙවියන්වහන්සේ ඊයේත් අදත් සදාකාලයටමත් ඒකාකාර ව සිටින සේක එබැවින් උන් වහන්සේව අත් නොහැර විශ්වාස කළ යුතුය.

එළියා අප හා සමාන ගති ඇති මනුෂ්‍යයෙක් වූයේය

එළියා අනාගත අනාගතවක්තෘ තුළින් තවත් උදාහරණයක් දකිමු. ශුද්ධ ලියවිල්ලේ එළියා ගැන මෙසේ සඳහන් වේ.***"එළියා අප හා සමාන ගති ඇති මනුෂ්‍යයෙක්ම සිටිය නමුත් වැසි නොවසින පිණිස ඔහු උනන්දු කමින් යාඥා කළේය. එවිට තුන් අවුරුදු සමයක් රටට වැසි නොවැස්සේය.ඔහු නැවත යාච්ඤා කළේය. එවිට අහසින් වැසි වැස පොළොවේ ඵල හට ගත්තේය."***(යාකෝබ් 5 :17 -18)ඔහු අපි වගේම මනුෂ්‍යයෙක් විය. එයින් අදහස් කරන්නේ ඔහු අනිත් අයගෙන් වෙනස් වූ අද්විතීය මනුෂ්‍යයෙක් නොවූ බවයි. ඔහු දෙවියන් වහන්සේව විශ්වාස කළා වූ සාමාන්‍ය මනුෂ්‍යයෙකු වූ අතර අවංකවම තමාගේ ජීවිතය දෙවියන් වහන්සේගේ කැඳවීම මත තබාගෙන උන්වහන්සේට ගෞරව කළ නිසා මනුෂ්‍යයන් ගේ හදවත් දෙවියන් වහන්සේ වෙතට නැවත හැරවීමට ඔහුට හැකි විය. එම කාරණය උදෙසා එළියා අනාගත වක්තෘ උද්යෝගිමත්ව යාච්ඤා කරනවා 1 රාජාවලිය පොතේ දී අපි දකින්නෙමු ඔහුගේ මොරගැසීමේදී ප්‍රධාන වශයෙන් ගැබ් වී තිබුණා වූ ස්වභාවය මෙසේය. "ස්වාමීන් වහන්ස..., මනුෂ්‍යයන් සිටින්නා වූ තත්වය කුමක් වුවත් ඔවුන්ගේ හදවත් නැවත ඔබ වහන්සේ වෙතට හැරෙව්ව මැනැව. එම යාඥාව නිසා අවුරුදු තුන හමාරක් ඇතුලත දී පැවතුණා වූ බොරු සැනසිල්ල පහව ගියේය. ඒ වන තෙක් සෙනඟ තමන්ගෙ අටුකොටු පිරී තිබුණු නිසා තෘප්තිමත්ව සිටියෝය. පෙනෙන්නට තිබුනා වූ සියල්ල යහපත් ය. එම නිසා සෙනඟ දෙවියන් වහන්සේ වෙතට නොහැරී සිටියා නොවේ දැයි බලන්න. දෙවියන් වහන්සේගේ කරුණාව තුළ උන්වහන්සේ ඉඩෝරය නියඟය පැමිණෙන්නට ඉඩහැර සියල්ල අහිමි වී යන්නට සැලසූ සේක. දෙවියන් වහන්සේ ඔවුන්ගේ අටු කොටු වලින් ඔවුන්ගේ ආහාර ද කුඹුරෙන් අස්වැන්නද සිඳ දැමූ සේක. බොරු අනාගත වක්තෘවරුන් වුවත් නැති වී යන්නා වූ මේ සියලු දේවල් වෙනුවෙන් අයදිමින් සිටියෝය. නමුත් සියල්ල අවසානයට පැමිණෙනවා පෙණුනේය. අවසානයේ දී දෙවියන් වහන්සේ සෙනඟගේ අවධානය උන්වහන්සේ වෙතට යොමු කර ගනු ලැබූ සේක.

අපිත් ජීවත් වෙන්නා වූ පැයේ දී මෙන් මනුෂ්‍යයන්ගේ හදවත් සෑම විටම සත්‍යතාවය ට නැවත විවෘත වීමට සැලැස් වූ සේක. මනුෂ්‍යයන් විඩාවට පත්ව සිටින විට සාතන් විසින් උඩඟු ලෙස හැසිරීම යහපත ලෙසත්, යහපත නපුර වශයෙනුත් සලකා ඉවත් කර දැමීමටත්, පොලඹවනු ලැබූවෝය. මනුෂ්‍යයන් වෙහෙසට (විඩාවට) පත්වී ව්‍යාකූල වන විට ඔවුන්ගේ දරුවන්ට එය බලපෑමක් කරනු

5 පිටුවට

4 පිටුවෙන්

යේසුස් වහන්සේ නිතරම

ලබන්නෝ ය. එවිට මනුෂ්‍යයන් රාජ්‍යතන්ත්‍රය පිළිබඳ කුතුහලයට පත්ව නායකයන් කොහෙද අපට සිදුවන්නේ කුමක්ද කියා ප්‍රශ්න නඟනු ලබති. එවිට සමාජයක් වශයෙන් අපි ක්ෂණිකවම අවදානමට ලක්වන අතර අවංකවම අප සැලකිල්ලට ගත යුත්තේ මොනවාද?

එවැනි අවස්ථාවකදී එළියා නැවත යාඥා කළේය. එළියා නියගය පිළිබඳ ව යාච්ඤා කළ පසු සෙනග තමන් මෙපමණ කල් විශ්වාස කළේ සැබෑ සාධර්ම නොවන බව අවබෝධ කර ගත්තේය. සෙනඟගේ හදවත් නැවත දෙවියන් වහන්සේ වෙතට හැරුණු බව දුටු විට එළිය ඔවුන් උදෙසා යාච්ඤා කරද්දි දෙවියන් වහන්සේගේ ආශිර්වාදය ඔවුන් වෙතට පැමිණියේය. එළියා යාඥා කරමින් තව සත්වරක් ගොස් මුහුද දෙස බලන්නැයි මෙහෙකරුවාට කීවේය . (1 රාජාවලිය 18 : 42- 43) එළියා අත් හරිනු ලැබුවේ නම් ඉතිහාසය වෙනස් වන්නේ කෙසේද...? ඔහු ජයග්‍රහණය ලැබෙන තෙක් ස්ථීර ව සිටිය නිසා දෙවියන් වහන්සේට ස්තුති වේවා. "සත්වෙනි වර ඔහු කතා කොට මනුෂ්‍යයෙකුගේ අතක් මෙන් කුඩා වලාකුළක් මුහුදෙන් නැඟී එන්නේ යැයි කීවේය ඔහුද වැස්ස ඔබ නොවලක්වනු පිණිස ඔබගේ රථය සූදානම් කරගෙන කරගෙන ගිය මැනවැයි කියා නුඹ ගොස් ආහාබ්ට කියාපාන්න යයි කීවේය" (1 රාජාවලිය 18 : 44) එළියා අනාගත වක්තෘ ර්ස්වර්ගයෙන් වර්ෂාව පැමිණ පොළවේ ඵල හට ගන්නා තෙක් පසුබට නොවී තදින් ආයාචනා කිරීම තෝරා ගත්තේය.

එළියා තුළ තිබූ ඇදහිල්ල සොයා දැන ගනිමුද

එළියා අනාගත වක්තෘ කළාක් මෙන් විශේෂයෙන් මේ අඳුරු පැයේදීත් පසුබට නොවී යාච්ඤා කිරීමට අපි ඉගෙන ගත යුතුය. එසේ වුවත් අවසානාවන්ත ලෙස ක්ෂණික ව අවබෝධ කර ගැනීම බොහෝ ජන සමාජයන් විසින් අහිමි කර ගෙන සභාවට සම්බන්ධ ව සිටියත් අවුරුදු දෙදහක් තිස්සේ අතීතයේදී මෙන්ම පිළිතුරු පෙනෙනතෙක් පීඩනයන්ට ලක් ව සිටිති එබැවින් යෙසුස් වහන්සේ ඇසුවා වූ ප්‍රශ්නයටත් සැලකිල්ලක් දක්වනවා ද ***"උන්වහන්සේ ඔවුන්ට වඩා ම යුක්තිය ඉෂ්ට කරන සේකැයි නුඹලාට කියමි එසේ වුවත් මනුෂ්‍ය පුත්‍රයා එන කල්හි පොළොවේ ඇදහිල්ල සම්බ වේ දැයි කී සේක"*** ලූක් 18 : 8 ස්වභාවිකව සිදුවිය නොහැකි කාරණාවකි ඇදහිලි වන්තයින් ඇදහිල්ලෙන් උන්වහන්සේ දෙස බලා සිටීම උන්වහන්සේ සොයන සේක අපි පිළිතුරු ලැබෙන තෙක් ඇදහිල්ලෙන් පිළිතුරු සොයන විට මම කිසිසේත් නුඹෙන් අහක්ව නොයමි උන්වහන්සේ පවසන සේක.

මනුෂ්‍ය පුත්‍රයා පැමිණෙන විට යම් කෙනෙක් අපගේ දේශයේ පිබිදීම ලැබෙන තෙක් උන්වහන්සේ දෙස බලා සිටිනවා හමුවන්නේද? 1857 දී මෙන් නිව්යෝර්ක් නගරයට ආත්මික පිබිදීම ගෙන ඒමට යම් කෙනෙක් උන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් සිටිනවා ද ? උන්වහන්සේගේ රාජ්‍යයේ දහස් ගණන් දෙනා නින්දේ පසු වෙති. එවිට යම් බලවත් දෙයක් කළ හැකි ද ? ස්වාමීනි මා වටා මගේ ඇස් වලට පෙනෙන සියලු දේ නොසලකා ඒවා එසේ තිබියදීත් මම ඔබ වහන්සේව විශ්වාස කරන්නෙමියි කියන්නා වූ අයව උන්වහන්සේ සොයන සේක. මම ඇදහිල්ලෙන් ඔබ වහන්සේට මොර ගසන්නෙමි. අප උදෙසා නොව මේ පරම්පරාවේ අය ඔබ වහන්සේගේ නාමයෙන් සාක්ෂිය දැනගන්න පිණිස ක්‍රියා කළ මැනව. ඔබ වහන්සේ ප්‍රකාශ නොවන සේකැයි අපගේ දරුවන් නොකියන පිණිස අපි මොරගසන්නෙමු. ඔබ වහන්සේගේ සමාව සහ සියලු කාරණා ලබා ගැනීම උදෙසා විශ්වාසයෙන් යාච්ඤා කරමින් එය ලබා ගැනීමට බලා සිටින්නෙමි. එබැවින් අපගේ ජාතිය වෙතට පව් කමාව වගුරුවන මෙන් ඉල්ලා සිටින්නෙමි. මගේ නගරයේ, මගේ පවුලේ, මගේ මිතුරන් අතරේ මගේ සේවාස්ථානය තුළ පව් කමාව වැගිරේ වුව මැනව. ඔබ ඔබවහන්සේ මට පිළිතුරු ලබා දෙන බව මම දනිමි. එමෙන්ම ඇස් වලින් එය දකින තෙක් යාඥා කරන්නෙමි.

අපි අත් නොහැර සිටින්නෙමු නම් අපගේ හදවත් වලින් විශ්වාස කලදේ අපගේම ඇස්වලින් දකින්නෙමු .

---

1 පිටුවෙන්

ඇමරිකාවේ එකම...

ඊශ්‍රායල් සෙනඟ දෙවියන් වහන්සේව සැබෑ ලෙස දැකීම අහිමිකරගෙන තිබුණි. එමෙන්ම ජාතියක් වශයෙන් උන්වහන්සේගේ න්‍යායපත්‍රය සම්පූර්ණ කළේ නැත. ඊශ්‍රායල් සෙනඟ තමන්ට පාලනය කරගත හැකි දෙයක් වශයෙන් පහසුවෙන් දෙවියන් වහන්සේ වෙතට ළඟා වීමට බලාපොරොත්තු වූයේ ය. ප්‍රධාන වශයෙන් (මූලිකවම) රජ කෙනෙක් නැතුව රාජ්‍යයක් ඔවුන්ට උවමනා වී තිබුණේ ය. රූකඩයක් මෙන් නැටවිය හැකි නාමමාත්‍රික රජකෙනෙක් ඔවුන්ට අවශ්‍යව තිබුණේ ය. ඒ අතරම ඔවුන්ට පාලනය කිරීමට පුළුවන් වූ දෙවි කෙනෙක් සිටීමට නම් දෙවියන් වහන්සේ වෙනුවට වෙනත් දෙවිවරු අවශ්‍යව තිබුණේ ය. ඕනෑම දෙවි කෙනෙකු හෝ රජ කෙනෙක් ඔබට පාලනය කළ හැකි නම් ඒ සැබෑ දෙවියන් වහන්සේ හෝ සැබෑ රජ කෙනෙක් නොවන්නේ ය. සැබෑ දෙවියන් වහන්සේ ඔබට උවමනා ආකාරයට සකස් කර ගත නොහැකිය. ඔබ උන්වහන්සේට උවමනා ආකාරයට සකස් විය යුතුය.

තමන්ගේ ජාතියේ මනුෂ්‍යයන්ගේ ජීවිත වලට අණ ගසන්නා වූ (මැදිහත් වන්නා වූ) සැබෑ දෙවියන් වහන්සේව ඊශ්‍රායල් ජනතාවට අවශ්‍ය වූයේ නැත. දෙවියන් වහන්සේගේ යෝජනා ඊශ්‍රායල් සේනග ආශාවට ඇලුම් වලට වඩා උසස්ව තිබූ බව මතක තබා ගන්න. වර්තමානයේ අපගේ ජාතියටත් අවශ්‍යව තිබෙන්නේ ඊශ්‍රායල් සෙනග බලාපොරොත්තු වුණා වූ ආකාරයේ දෙවි කෙනෙක්ව බව පෙනෙන්නේ ය. අපගේ ජාතියට අවශ්‍යව තිබෙන්නේ ප්‍රණාමය දැක්විය හැකි කෙටි නමස්කාරයක් සහ යාඥාවක් ඔප්පු කර ප්‍රසිද්ධ රැස්වීමට පෙර ඉක්මනින් දෙවියන් වහන්සේ වෙතින් ඈත්ව යාමයි.

ඉශ්රායෙල් සෙනඟ මඟ හැරගෙන තිබූ දෙවන කාරණය වන්නේ පූජකයන්ගේ ඉගැන්වීම නොමැතිව සිටීමයි. ඔවුන් පූජකයා නොමැතිව සිටියා යැයි 2 ලේකම් 15 වන පරිච්ඡේදය සඳහන් වන්නේ නැත. නමුත් පූජකයන් සත්‍යතාවය ඉගැන්වීම නතර කර දමා තිබුණි. විනෝදය උදෙසා ඉගැන්වීම අවබෝධ කර ගැනීම ඔවුන්ට අවශ්‍යව තිබුණෝය. කැඳවනු ලැබුවා වූ සෙනඟ වශයෙන් දෙවියන් වහන්සේ වහන්සේව අල්ලා ගත්තේ නැත. කායිකව සහ මානසිකව පිරිහුණු සමාජ ශාලාවක දී මෙන් නමස්කාරය කළෝය. හෘද සාක්ෂිය තුළ ඇති හැදියාව සහ ජීවිතයේ මධ්‍යස්ථානය ලෙස දේව සභාවට ඇලුම් වීම සිදුවූයේ නැත. ශුද්ධ ලියවිල්ලේ ආධිපත්‍යය ගෞරවනීයව පවත්වන්නා වූ ආගමික නායකයන් නොමැතිකම නිසා ඊශ්‍රායල් සෙනඟ දුක් විඳින්නෝ ය .

ඇමරිකාව තුළ (අපගේ දේශය තුළ) වර්තමානයේ දී ද එම තත්ත්වය නිරතුරුවම දකින්නෙමු. බොහෝ පාලකවරු මනුෂ්‍යයන් ව සතුටු කිරීමට දේශනා කරනු ලබති. ඊට හේතුව යම් කෙනෙක් පැමිණ මේ ආකාරයේ දේශනා ඇසීමට අපි කැමති නැතැයි කියා දේවස්ථානයෙන් පිටත්ව යයි කියා බයෙන් සිටීමයි. නමුත් පාලකවරයා දේශනා කරන්නේ දේව වචනය නම් එවැනි ප්‍රතිචාරයක් වැරදි සහගත ව තිබේ. වැදගත් කාරණය වන්නේ පාලකවරයා දේශනා කරන්නේ ප්‍රසිද්ධ වීමට නොව සැබෑ පණිවිඩය ලබා දීමටයි. දේශපාලනඥයන්ට අවශ්‍ය වන්නේ ප්‍රසිද්ධ වීමයි. දේව වචනය දේශනා කරන අය සත්‍යතාවය ප්‍රකාශ කිරීම අවශ්‍ය ව තිබෙන්නේය.

ඉශ්රායෙල් සෙනඟ මඟ හැරගෙන තිබුණා වූ තුන්වන කාරණය වූයේ දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවයි. සංස්කෘතිය විසින් දෙවියන් වහන්සේ පිළිබඳ දැක්ම නිවැරදි තොරතුරු මත ගොඩ නගා තිබුණි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ව්‍යවස්ථාව මඟ හැරීම සහ දුෂ්ටකම වර්ධනය වීම නිසා ඇතිවන අවිශ්වාසය වැළැක්වීමට පටන්ගත් සේක. දෙවියන් වහන්සේ අද දවසේ අපගේ ජාතිය වේගයෙන් පිරිහීමට ලක්වීම ඉවත් කර එය වළක්වා අව්‍යාජ බව ඇති කරන බවට ඔබ සහ මම සාක්ෂි කරුවන් වන්නෙමු. නැවත වාරයක් දෙවියන් වහන්සේ සමාජ සංස්කෘතිය තුළ ඇති ස්වභාවය ඉවත් කර දමා හෝ නො වැදගත් සේ සලකා ධර්මිෂ්ඨ තත්ත්වයට සමාජය ගෙන එමින් ප්‍රචණ්ඩ සතුරා සහ බිය ජනක දුෂ්ටකම් පරාජය කර දෙවියන් වහන්සේ වෙතින් ඈත්ව සිටීමේ අත්දැකීම් වල ප්‍රතිඵලය පෙන්වා දෙන සේක. (රෝම 1 : 18 - 32) ඊශ්‍රායල් තුළ සිදුවී තිබුණේ කුමක් ද ? අපගේ දේශය තුළ විවිධ තරාතිරම්වල අයට වර්තමානයේ සිදු වී තිබෙන්නේ කුමක්ද ?

දෙවියන් වහන්සේගේ සත්‍යතාවය නියෝග අතපසු කර තිබෙන විට සමාජය තුළ නැවත ව්‍යාකූලත්වය ඇති වේ. දෙවියන් වහන්සේ නොමැතිව ඔබට සමාජයට සැලසුම් සහ නියෝග ලබා දීමට නොහැකිය. අපි දෙවියන් වහන්සේ වෙතින් ඈත සිටින්නේ නම් අපි තෝරා ගනු ලැබූවන් වුවත්, අප ආරම්භ කිරීමට සැලසුම් කර තිබෙන්නේ මොනවා වුවත් අපට කිසිවක් කළ කළ නොහැකි වන්නේය. අපි දෙවියන් වහන්සේ සමග නැවත හරි ගැසෙන තුරු වරද නිවැරදි කර ගැනීමට හෝ අප මැදි ව සිටින්නා වූ අපගේ මාර්ග වලින් ඉවත් වීමට අවශ්‍ය මිලය ගෙවීමට හැකියාවක් ලැබෙන්නේ නැත. වර්තමානයේ ඇමෙරිකාව තුළ (අපගේ දේශය තුළ) ඇති මෙම තත්ත්වය අපගේ හදවත් වල තිබෙන ප්‍රශ්නයයි. බොහෝ පුද්ගලයන්, පවුල්, සභාවන් ජන සමාජයන් දෙවියන් වහන්සේ මත රැඳී සිටීමට තීරණ ගැනීමේ කෙළවරට පැමිණ සිටින්නහු ය. අපට අවශ්‍ය නම් අපට සමීප වීමට දෙවියන් වහන්සේට හැකියාව තිබෙන සේක. නමුත් අපගේ සැලසුම් සහ සතුට මගහැර උන්වහන්සේ ක්‍රියා නොකරන නිසා උන් වහන්සේව ඈත් කර තැබීමට අපගේ ක්‍රියා වලට හැකි වේ.

දෙවියන් වහන්සේ සහ අප අතර පරතරයක් තිබෙන තෙක් සහ අධර්මිෂ්ඨකම් නියෝග පවතින තෙක් අපගේ දේශයේ පාලනය උන්වහන්සේ භාරනොගන්නා සේක. යටහත්ව අයැද සිටීමේදී ආශිර්වාද කිරීම උදෙසා ප්‍රමාණවත් ලෙස උන්වහන්සේ සමීප වන සේක. නමුත් තීරණ ගැනීමට උන්වහන්සේ අපට ඉඩ හැර තිබෙන සේක. ඊශ්‍රායල් සෙනඟ දෙවියන් වහන්සේගෙන් ඈත සිටින අතර එහි ප්‍රතිඵලය වූයේ විනාශය සහ මරණයයි. 2 ලේකම් 15 වන පරිච්ඡේදයේ දී අපි මෙලෙස කියවන්නෙමු. ***"ඒ කාලවලදී පිටත ගිය කෙනෙකුටවත්, ඇතුලට ආ කෙනෙකුටවත් කිසි සමාදානයක් නැතුව දේශවල සියලු වැසියන්ට මහත් පීඩා ඒ නිබුණේය."***

(2 ලේකම් 15 : 5)

එම වචනය ශබ්දය ඉතා තියුණු ලෙස පවතින්නේ ය. ***"ජාතියක් කරුණු කොටගෙන ජාතියක් ද, නුවරක් කරුණු කොටගෙන නුවරක්ද, පොඩි කරනු ලැබුවෝය."*** (2 ලේකම් 15 : 6)

මෙම විරුද්ධ වාදී කම දේශීය සහ ජාත්‍යන්තර තත්ත්වයන්ගෙන් පවතින්නේය. එම පදයේ ම තවදුරටත් මෙසේ සඳහන් වේ. ***" එක්නිසාද, දෙවියන් වහන්සේ සියලු ආකාර විපත්ති වලින් ඔවුන් පෙලූ සේක."*** (2 ලේකම් 15; 6)තවත් ආකාරයකින් පවසන්නේ නම් සාමූහික වගකීමක් ඇති බව දෙවියන් වහන්සේ හඟවා දෙන සේක. අපගේ දේශය උන්වහන්සේගේ ශරීරය ලෙස නැවත ගොඩනැගීමේ අත්දැකීම අපට අවශ්‍ය නම් ඊට අවශ්‍ය සියලු දේ උන්වහන්සේ ලබා දෙන සේක.

මෙම කැඳවීම ලොව වටා ඇති අවශ්‍යතාවයයි.

"මා වෙතට හැරී වරෙල්ලා "

සාරා ෆ්ලූකස් මොරේ විසිනි

එස්තර් රැජින සහ යුදෙව් සෙනඟ වහල්කමට හසුව සිටින විට භයානක ලෙස විනාශ වීමට නියමිතව තිබුණේය. ඔවුන් නිරාහාරව යාච්ඤා කළෝ ය. එවැනි බරක් ඔවුන්ට ඇති වූයේ විනාශකාරී තර්ජනය නිසා ය . දින තුනක් නිරාහාරව සිටීමින් මේ මහත් අවශ්‍යතාවය වෙනුවෙන් ඔවුන් යාඥා කරනු ලැබුවෝය.

අපිත් සිටින්නේ ලෝකය එවැනි අර්බුදකාරී දවස් වලට පත්ව සිටින විටදී බව අපි අවබෝධ කර ගෙන නොමැත. වර්තමානයේ දී වුවත් එවැනි අර්බුද වල දී උපකාර කිරීමට මගහැරිය නොහැකි ලෙස අපව කැඳවා තිබෙන සේක.(යෙරමියා 29: 11 - 13) නිරාහාරව යාච්ඤා කිරීමට අනෙකුත් සියලු දේ පසෙකින් තබා ධර්මිෂ්ඨකමේ වර්ෂාව අප වෙත පැමිණෙන තෙක් ස්වාමීන් වහන්සේව සෙවීමට උන්වහන්සේ අපව කැඳවා තිබෙන සේක . (හොෂෙයා 10:12) සියලුම කාලවලදී නිරාහාර යාච්ඤාවෙන් ස්වාමීන් වහන්සේගේ කරුණාව සොයන විට දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව ඔවුන්ගේ සතුරන්ගෙන් මුදා ගනු ලැබූ සේක. ගැලවුම්කරුවාණන් වූ යේසුස් වහන්සේ නිරාහාරව යාච්ඤා කළා පමණක් නොව උන් වහන්සේගේ ගෝලයන් ට ද නිරාහාරව යාච්ඤා කිරීම ගැන ඉගැන්වූ සේක. එපමණක් නොව නිරාහාරව යාච්ඤා කිරීමේදී තමාවම වංචා කර ගන්නා ලෙස නො කරන්නැ යි කී සේක. (මතෙව් 6:16-18)

දිව්‍යමය මැදහත්වීම

කිතුනුවන් නිරාහාරව සිටින විට ඔවුන්ගේ ප්‍රථම අවධානය දෙවියන් වහන්සේ මත රැඳී තිබෙන්නේ ය. පිබිදීම සහ ලෝකයේ සෑම තැනකම ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම උදෙසා අපි නිරාහාරව යාච්ඤා කරන විට එයින් අදහස් කරන්නේ දෙවියන් වහන්සේගේ පිබිදීම උදෙසා බලා සිටීම සහ යාච්ඤා කරන මනුෂ්‍යයාගේ මුළු හදවත සහ මුළු ජීවිතය ඊට යොමු කිරීම තීරණාත්මක සාධකයක් ව තිබෙන බවයි. මුළු හදවතින්ම තමන්ගේ පවුලේ අය, ප්‍රේම කරන්නා වූ අය, සභාව හෝ ජාතිය උදෙසා නිරාහාරව යාච්ඤා කරන විට එයින් අදහස් කරන්නේ ආහාර සහ අනෙකුත් සියලු දේ පසෙකට දමා ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම උදෙසා බලවත් ලෙස යාච්ඤා කිරීම යි.

ඉතිහාසයේ දී තීරණාත්මක කාරණයක්, තදබල අනතුරු සහිත ව්‍යසනයක් පැමිණ විට දෙවියන් වහන්සේගේ සෙනඟ උන්වහන්සේගේ මුහුණ සොයමින් උද්යෝගයෙන් යුතුව නිරාහාරව යාඥා කළේය ජය ගනු ලැබූවෝය. නිනිවෙයේ සෙනඟ දෙවියන් වහන්සේගේ කරුණාව සොයමින් පසුතැවිලි වී මනුෂ්‍යයකු වත් මෘගයෙකු වත්, කෑමවත්, වතුර වත් නොමැතිව නිරාහාරව යාඥා කළේය. (යෝනා 3:7-8) අහස්චේරෝෂ් රජුගේ කාලයේ දී යුදෙව් ජනතාව සම්පූර්ණයෙන්ම විනාශ කර දැමීමේ අනතුරට මුහුණ දී සිටින විට යුදෙව්වන් දින තුනක් වතුරවත් නොබී යාච්ඤා කළෝ ය. (එස්තර් 4:5-16) ඒ දවසේ දී විනිශ්චයට ඉහළින් කරුණාවේ ජයග්‍රහණය ඔවුන් ලැබූවෝය. අපගේ දවස්වල දීත් අපි අපගේ ජීවිත යටහත් කරගෙන දිව්‍යමය මැදිහත් කාරකම උදෙසා ස්වාමීන් වහන්සේගේ මුහුණ සොයන්නේ නම් අපිත් ජයග්‍රහණය ලබන්නෙමු.

වර්තමානයේ දී යුදෙව්වන් සහ අන්‍ය ජාතීන් යන දෙගොල්ලන්ම ඉතා ඉක්මනින් භියට පත් වේ. සාතන්ගේ බලය කරුණු කොටගෙන ලෝකයේ පැවැත්ම ආක්‍රමණය කරනු ලබන්නේ ය. නිරයේ බලය පැවැත්වීම සඳහා උත්සාහ කරන බලයට අභියෝග කරමින් ධර්මිෂ්ඨකමේ ශක්තිය (බලය) කරුණු කොට ගෙන එය පලවා හැරිය යුතුය. දෙවියන් වහන්සේ පැමිණ ධර්මිෂ්ඨකමේ වර්ෂාව අප වෙත වගුරුවන තෙක් අපගේ මුළු හදවතින් අපි දෙවියන් වහන්සේව සෙවිය යුතුය.

ආහාරවලට නින්දට, ව්‍යාපාරවල දියුණුව ට, නෑදෑයන්ට, මිතුරන්ට වඩා වැඩියෙන් අපගේ පවුල තුළ, සභාව තුළ, ජාතිය තුළ පිබිදීම ලබාගැනීම අවශ්‍ය ව තිබේ. දැන් නොපමාව අපගේ කාර්යයන් පසෙක දමා විනාශයට නියම වුණු නිනිවය ප්‍රීතියට හරවා ගැනීමට ක්‍රියා කළාක් මෙන් දේව සේවකයන් සහ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය වන සභාවේ සාමාජිකයන් ලෙස එක හදවතකින්, එක මනසකින් යුතුව ලෝ වටා සෑම තැනම ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම සඳහා ස්වාමීන් වහන්සේගේ මුහුණ සොයමු. සියලු දෙනා හදවත්වලින් එක්ව දෙවියන්වහන්සේ තුළ සිට යාච්ඤා කරමු. දෙවියන් වහන්සේ අපගේ ජාතිය මුදා ගන්නා සේක.

"එහෙත් දැන්වත් නුඹලාගේ මුළු සිතින් ද, නිරාහාරව සිටීමෙන් ද, ඇඬීමෙන් ද, වැලපීමෙන් ද, මා වෙතට හැරී වරෙල්ලා යයි ස්වාමීන් වහන්සේ කියන සේක. එසේය, නුඹලා ගේ වස්ත්‍ර නොව නුඹලාගේ සිත් ඉරාගෙන නුඹලාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ වෙතට හැරියල්ලා. මක්නිසාද, උන්වහන්සේ දයාවන්ත වූ, අනුකම්පාවෙන් පූර්ණ වූ, ඉවසිලිවන්ත වූ ඉතා කරුණාවන්ත කෙනෙක් ය. උන්වහන්සේ විපත්තිය ගැන තැවෙන සේක. සමහරවිට උන් වහන්සේ හැරී ඇවිත් නැවී, උඹලගේ දෙවියෝ වූ ස්වාමීන්වහන්සේට ඔප්පු කිරීමට ආහාර පූජාවක් ද, පාන පූජාවක්ද, අඩංගු ආශීර්වාදය දීලා යනවා අද්දෝ යි දන්නේ කවුද.? සියොන්හි හොරණෑව පිඹ ශුද්ධවූ උපවාසයක් ද, රැස්වීමක්ද, ප්‍රසිද්ධ කරපල්ලා. සෙනඟ රැස් කර ශුද්ධවූ සභාවක් පවත්වා පල්ලා. මහල්ලන් එකතු කර ළමයින්ද, කිරි දරුවන් ද, එක්කාසු කරපල්ලා. මනමාලයා තමාගේ ගෙයින් ද, මනමාලි ඇගේ ඇතුළුගෙයින් ද, පිටතට එත්වා. ස්වාමීන් වහන්සේගේ සේවකයෝ වූ පූජකයෝ ද්වාර මණ්ඩපය සහ පූජාසනය අතරෙහි සිට අඬමින් ස්වාමීන් වහන්ස ඔබගේ සෙනඟට කරුණා කළ මැනව, ඔවුන් කෙරෙහි ජාතීන් විසින් ආණ්ඩු කරන හැටියට ඔබගේ උරුමය නින්දාවට පාවා නුදුන මැනව.ඔවුන්ගේ දෙවියන් වහන්සේ කොතැනදැයි ජනයා නිතර මක්නිසා කියනු ලඛන්නේ දැයි කියත් වා. එකල ස්වාමීන් වහන්සේ තමන්ගේ දේශය ගැන ඊර්ෂ්‍යා වී තමන්ගේ සෙනඟට අනුකම්පා කළ සේක. ස්වාමීන් වහන්සේ තමන් සෙනඟට උත්තර දෙමින් මෙන්න නුඹලා තෘප්තියට පැමිණ ලෙස ධාන්‍යද, තෙල්ද, මිදි යුෂ ද, නුඹලා මෙන එවම්. මම ජාතීන් අතරෙහි නුඹලා නවත් නින්දාවක් නොකරන්නෙමි. මම උතුරු හමුදාව නුඹලා වෙතින් ඈත් කර ඔවුන් නිසරු පාළු දේශයකට ඔවුන්ගේ ඉස්සරහ කොටස නැගෙනහිර මුහුදුටත් පසු කොටස බස්නාහිර මුහුදුටත් පන්නා දමන්නෙමි. මෙසේ ඔවුන් උඩඟු කම් කළ බැවින් ඔවුන් ගඳ, ගසා ඔවුන්ගේ දුර්ගන්ධය නහින්නේ යැයි කියනවා ඇත. එම්බා දේශය, ඔය නොවී ප්‍රීති සන්තෝෂ වන්න. මක්නිසාද, ස්වාමීන් වහන්සේ මහත් දේ කළ සේක. වනයේ මෘගයෙනි, ඔය නොවේ මක්නිසාද, කාන්තාරයේ ගොදුරු බිම් වල තෘණ හටගනී. ගස් ද, පලදෙයි. අත්තික්කා ගස ද, මිදි වැලද, ඒවායේ ස්ව රසය දෙති. ඉනින් සියොන් පුත්‍රයෙනි, නුඹලාගේ දෙවි වූ ස්වාමීන් ස්වාමීන් වහන්සේ කෙරෙහි ප්‍රීති සන්තෝෂ වෙයල්ලා. මක්නිසාද, උන්වහන්සේ නුඹලාට පළමු වර්ෂාව නිසා තරමට දුන් සේක. තද, වැස්ස වන පළමුවෙනි වර්ෂාවද, පළමුවෙනි මාසයේ අන්තිම වර්ෂාවද, උන්වහන්සේ නුඹලා උදෙසා වස් වනවා ඇත. එවිට කමත් ධාන්‍ය වලින් පිරෙනවා ඇත. මිදි යුෂ ද, තෙල්ද, පැස්වලින් ඉනිරෙනවා ඇත. මා විසින් උඹලා අතරට එව්වා වූ මාගේ මහත් හමුදාව වන පළඟැටියන් ද, කෙඳි පළඟැටියන් ද, කපන පළඟැටියන් ද, පළඟැටි පණුවන් ද, නාස්ති කලා වූ අවුරුදු මම නුඹලාට නැවත දෙන්නෙමි. නුඹලා වනාහි කෑම කා තෘප්තියට පැමිණ නුඹලා ගැන පුදුම ලෙස ක්‍රියා කළා වූ නුඹලාගේ දෙවි වුස්ව මින් වහන්සේගේ නාමය වර්ණනා කරන්නාහුය. මාගේ සෙනඟ කිසිකලෙකත් ලැජ්ජාවට පත් නොවන්නෝ ය. මා ඊශ්‍රායෙල්වරුන් අතරේ සිටින බවත් මා නුඹලාගේ දෙවි වූ ස්වාමීන් වහන්සේ බවත් වෙන කෙනෙක් නැති බවත් උඹලා දැන ගන්නවා ඇත. මාගේ සෙනඟ කිසි කලෙකත් ලැජ්ජාවට ලැජ්ජාවට නොපැමිණෙන්නේය. ඉන්පසු මාංසමය වූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරු වන්නෙමි. උඹලගේ පුත්‍රයෝද, දූවරු ද, අනාගත වාක්‍ය කියන්නෝය . නුඹලාගේ මහල්ලෝ ස්වප්න දකින්නෝ ය. නුඹලාගේ යෞවනයන්ට දර්ශන පෙනෙනවා ඇත. ඒ දවස් වල දී දාසයන් සහ දාසීන් කෙරෙහි පවා මාගේ ආත්මය වගුරු වන්නෙමි . තවද, අහසෙහින් පොළවෙහින් පුදුම එනම් ලේ ද, ගිනි ද, දුම් කණුදක් පෙන්වන්නෙමි. ස්වාමීන් වහන්සේගේ මහත් වූ භයානක වූ දවස පැමිණෙන්නට පළමුවෙන් ඉර අඳුරු වන්නේ ය. හඳ ලේ වන්නේය. තවද, ස්වාමීන් වහන්සේගේ නම කියා යාච්ඤා කරන කවුරු නමුත් ගැලවෙනවා ඇත. මක්නිසාද, ස්වාමීන් වහන්සේ කී ලෙස ගැලවෙන අය ද, ඉනිරි අය අතරේ ස්වාමීන් වහන්සේ කැඳවන අයද, සියොන් කන්දෙහින් පෙරුසෙලමේ හි ත් සිටිනවා ඇත." (යෝවෙල් 2:12-32)

පිබිදීම පැමිණීමට පෙර සෑම ස්ථානයකම සිටින දේව දරුවන් තියුණු ලෙස ස්ථිරවම ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැගිරීම උදෙසා නිරාහාරව යාච්ඤා කරමින් ස්වාමීන් ස්වාමීන් වහන්සේගේ මුහුණ සෙවිය යුතුය. (යෝවෙල් 2:1, 13-17) මෙය දැකීමට අවශ්‍ය වන නිසා අප කිසිවෙක් තමන්ගේ ජීවිතය ගැන නිදහසට කරුණු ඉදිරිපත් නොකර අපගේ මුහුණු ස්වාමීන් වහන්සේව සෙවීමට යොමු කර නිනිවයේ සෙනඟ ඔවුන්ගේ දවස් වල දී විනාශයට නියම වූ තත්ත්වයෙන් නිදහස් වීමට කටයුතු කළාක් මෙන් ක්‍රියා කරමින් එක්සත් ව නිරාහාර ව යාච්ඤා කිරීම කරුණු කොට ගෙන එහි ප්‍රතිඵලය ලෙස අපගේ වර්තමාන තත්ත්වය තත්ත්වය වෙනස් කර ගනිමු. පිබිදීම උදෙසා මෙබඳු ආකාරයේ යාච්ඤා වලට ක්‍රිස්තුස් වහන්සේගේ මහිමය උදෙසා පිළිතුරු ලබාදෙමින් සාතන් ගේ සේනාව පළවා හරිමින් පවිත්‍ර කරන ලෙසත්, ආත්මයාණන් වහන්සේගේ කඩුව පාවිච්චි කිරීමටත් දෙවියන් වහන්සේගේ සභාවට බලය ලබා දෙන සේක. දෙවියන් වහන්සේගේ කරුණාව තුළ අරමුණ සම්පූර්ණ කරන සේක. එමෙන්ම මේ කාලයේදී විනිශ්චය අවසන් කරන සේක. (එපීස 5:26-27, මාර්ක් 16:15-20 බලන්න)

තරුණ වයසේ පුරුෂයා නිසා ගෝනි රෙදි ඇඳ සිටින කන්‍යාවක් මෙන් වැල පියන්න.

පිබිදීමට බාදා කරන්නා වූ අප තුළ තිබෙන පාපය ඉවත් කරගැනීම පිණිස අපි අපගේ හදවත් සෝදිසි කර ගත යුතුය. අපි ඉතා ඉක්මනින් දෙවියන් වහන්සේ වෙතට හැරී අපගේ දුර්වලකම් සහ අසාර්ථක කම් ගැන පසුතැවිලි වී අපගේ වාතාවරණයන් හරි ගස්වා ගැනීමට උන් වහන්සේව සොයමු. ඉතා යටහත්ව අපගේ පාපය අත්හැර සහ ක්‍රියා විරහිත කර පසුතැවිලි වෙමින් ධර්මිෂ්ඨකම වෙනුවෙන් යාඥා කරමු. නිරාහාරව යාච්ඤා කිරීම කරුණු කොට ගෙන මිස ස්වාමීන් වහන්සේගේ සමහර කාරණාවන් සහ ආශීර්වාද ලබා ලබා ගැනීමට නොහැකිය. පිබිදීම එයින් එක් කාරණයකි. පිබිදීම නොපැමිණෙන විට අප අතරේ දෙවියන් වහන්සේගේ බලය සහ අභිමුඛත්වය ප්‍රකාශ නොවන විට සහ උන්වහන්සේගේ උදහසේ ක්‍රියාවන් ප්‍රකාශ වන විට යොෂුවා සහ ඊශ්‍රායල් වැඩිමහල්ලන් අතරේ සිදු වුණාක් මෙන් යම් දෙයක් වැරදී ඇති බව අවබෝධ කරගත යුතුය. (යොෂුවා 7:6) එවිට නිරාහාරව යාච්ඤා කරමින් උදැසන සිට සවස් වන තෙක් වනතෙක් වුවත් දෙවියන් වහන්සේ ඉදිරියේ මුණින් වැටී සිටිමු. නපුරාගේ බලය ජය ගෙන තිබෙන්නේ සහ උන්වහන්සේගේ සෙනඟ වන අපි පරාජයට සහ බලය රහිත තත්ත්වයට පත්ව තිබෙන්නේ ඇයි? කියා දෙවියන් වහන්සේ අනාවරණය කරනු ලබන සේක.

නිරාහාරව යාච්ඤා කිරීම සමග නිතර සැබෑ පසුතැවිලි වීම සම්බන්ධ වන්නේය. අපගේ පාපය ගැන පසුතැවිලි නොවී නො වීමෙන් ලැජ්ජාවට පත්වීමට ඉඩ නොහරිමු. අපගේ හදවත් වල සැබෑ වෙනස්වීමක් නැතිව වන්දිය ගෙවීමට උත්සාහ නොකර, පාපය ගැන සැබෑ කනගාටු වීමක් නැතිව, අවංක නොවී, රැවටිලිකාර ලෙස දෙවියන් වහන්සේ වෙතට හැරී ඒමට පුලුවන්ද ? දුෂ්ට වූ පාපයේ අප්‍රසන්න ක්‍රම සඟවා ගැනීමෙන් පරාජය සැහැල්ලුවෙන් සලකනු ලබති. මෙම තීරණාත්මක දවස් වල දී අපගේ හදවත් සෝදිසි කර ගැනීමට සහ සභා පිබිදීම ආපසු හරවනු ලබන පිණිස අප තුළ ඇති දේවල් ඉවත් කර දැමීමට දෙවියන් වහන්සේ අපව කැඳවන සේක. නිරාහාරව යාච්ඤා කිරීමට ප්‍රමාණවත් ලෙස කාලය වැය කරන්නේ නම් අපගේ හදවත් සෝදිසි කරගෙන බිදුනාවූ හදවතකින් දෙවියන් වහන්සේ වෙතට හැරී එන විට ස්වාමීන් වහන්සේ පැමිණ ධර්මිෂ්ඨකමේ වර්ෂාව අප වෙත වගුරුවන සේක. (හොෂෙයා 10:12)

"නුඹලාගේ සිත් ඉරාගෙන..." (යෝවෙල් 2;13)

නිරාහාරව යාච්ඤා කිරීම පාපයෙන් ජය ජය ගැනීමට අපව මෙහෙය වන්නේ ය. ඔබ යන්නා වූ සෑම ස්ථානයකදී කිතුනුවන් සාතන්ගේ පරීක්ෂාවලට නිරතුරුවම ගොදුරු වී සිටින බව සොයා ගත හැකිය. ඔවුන්ට අනිත් අයට ප්‍රේම කළ නොහැකිය. ඔවුන් විනාශ වෙන්නා වූ

7 පිටුවට

"තව ද විපත්ති දවසේ දී මට යාච්ඤා කරව. මම තා මුදා හරින්නෙමි. තෝ මට ගෞරව කරන්නෙහිය."(ගීතාවලිය 50:15)

6 පිටුවෙන්

මෙම කැඳවීම ...

ආත්ම ගැන ප්‍රේමයෙන් කටයුතු කරන්නේ නැත. ස්වාමීන් වහන්සේ උදෙසා අඛණ්ඩව කැප වීමට උත්සාහ දරන්නේ නැත. එවැනි අසාර්ථක කිතුනුවන්ට ජයග්‍රහණය ලැබිය හැකිද? නිරාහාරව යාඥාවෙන් දෙවියන් වහන්සේ මත රැඳී සිටීම තුළින් කිතුනුවන්ට මහිමාන්විත ව ජය ගත හැකිය. අනෙකුත් සියලුම කාර්යයන් සියලුම සතුට පසෙක තබා මුළු හදවතින්ම ස්වාමීන් වහන්සේව සෙවීම තුළ පසුතැවිලි වී නිරාහාරව යාඥා කිරීමෙන් පාපයෙන් සහ ආත්මාර්ථකාමී බවෙන් සහතික ලෙසම ජය ගත හැකිය.

නමුත් ඇදහිල්ල නැතුව උන් වහන්සේව ප්‍රසන්න කරන්ට නුපුළුවන. මක්නිසාද දෙවියන් වහන්සේ වෙතට ලඟා වෙන්න විසින් උන්වහන්සේ විද්‍යාමාන බවත් උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාස කරන්ට ඕනෑය. (හෙබෙව්11:6) ඇදහිල්ලෙන් යාච්ඤා කිරීමට ඉල්ලා සිටින සේක. නිරාහාරව ඇදහිල්ලෙන් යාච්ඤා කිරීම වඩා වැඩියෙන් ඉල්ලා සිටින සේක. නිරාහාරව යාඥාවෙන් ස්වාමීන් වහන්සේව සෙ වීම තුලින් මහත් වූ ආශාව මහත් වූ අධිෂ්ඨානය, මහත් වූ ඇදහිල්, පෙනෙන්නේය. නිරාහාරව නොමැතිව පිබිදීම උදෙසා කරන අපගේ යාච්ඤාව නිතරම නොගැඹුරු සරල හා අවංක නැති එකක් ව තිබේ. නිරාහාරව කරන යාඥාව තුළින් දෙවියන් වහන්සේට සහතික ලෙස ප්‍රකාශ කරනු ලබන්නේ අපි අවංකවම මිලය ගෙවීමට කැමති බවයි. සියලු ජාතීන් උදෙසා කරන අපගේ යාච්ඤාවෙන් ජාතීන්ගේ සියලුම ක්‍රියාවන් යටපත් කරනු ලබන්නේ ය.

ලොව වටා ආත්මයාණන් වහන්සේගේ වැගිරීම් ඒ පොරොන්දුව ප්‍රමාද නොවී අත්පත් කර ගැනීමට දැන් අපි කළ යුතු වැදගත්ම කාරණය වන්නේ අපගේ සම්පූර්ණ වූ සිතින් ස්වාමීන් වහන්සේ වෙත හැරී ඒමයි. අපගේ යුද්ධායුධ මාංශික නොවේ නමුත් ඒවා බලකොටු බිඳ හෙලීමට තරම් බලවත්ය. යාච්ඤා කිරීම ඉතා බලවත් වූ යුද්ධායුධයකි. නොසෑලී එක්සිත්ව කරන්නාවූ නිරාහාර යාච්ඤාව ඉදිරියේ නොසැලී සිටීමට පුළුවන් වූ සතුරාගේ කිසිදු බලයක් නොමැති බව තහවුරු වන්නේය. මුළු ආත්මයෙන් යටහත් කමින් උද්යෝගිමත්ව කරන්නාවූ නිරාහාර යාච්ඤාව දෙවියන් වහන්සේගේ වහන්සේ ගේ පාලනය යටතේ තිබෙන්නාවූ, ස්වර්ගයෙන් පැමිණෙන්නාවූ, තේජාන්විත බලය ලබාදීමට ආත්මයාණන් වහන්සේගේ වැගිරීමට ලෝවටා සියල්ලන්ම උද්යෝගිමත් කිරීමට වේගයෙන් මාර්ගය විවෘත කර ගැනීම සඳහා තීරණාත්මක සාධකයක් වන්නේය. මෙම ශුද්ධ වූ බලය හැර වර්තමානයේ පොළොව තුළ පවතින සාතන් ගේ ප්‍රචණ්ඩත්වය පලවා හරිමින් මුදාගැනීමට වෙන කිසිවක් නොමැත.

දෙවියන් වහන්සේගේ මහිමාන්විත එළිදරව් කිරීම තුළ උන්වහන්සේට කීකරු වෙන්නා වූ උන්වහන්සේගේ සෙනග සමග උන්වහන්සේගේ කරුණාව සහ ගිවිසුම රැඳී පවතින්නේ ය. එබැවින් ලවෝදික සභාවේ අන්ධ කම ගැන අනාගත වාක්‍යයෙන් පැවසූ සේක. (එලිදරව් 3;14-19) අපි අපගේ දෑස් දෙවියන් වහන්සේගේ ආලේපයෙන් ආලේප කර ගනිමු. යොවෙල් අනාගත වක්තෘගේ පොතේ ස්වාමීන් ස්වාමීන් වහන්සේගේ දවස උන්වහන්සේගේ දෑතේ තිබෙන බව සඳහන් වන බැවින් මෙහි පැය සඳහා දෙවියන් වහන්සේගේ ආඥාව සහ පොරොන්දුව අපි දකිනවද...? අන්තිම වර්ශාවේ ගිවිසුම සම්පූර්ණ වීම සඳහා අපගේ කොටස ඉටු කිරීමට උන්වහන්සේගේ කරුණාවේ බලය ලබා දෙන ලෙසත් නිරාහාරව යාච්ඤා කිරීම තුළ උන්වහන්සේට එකඟ විය හැකි ලෙස කටයුතු කරමින් උන් වහන්සේව දැකීමටත් අපි අයැද සිටිමු. කඳුලු සලමින් වේදනාවෙන් යුතුව වරද පිළිගෙන පසුතැවිලි වෙමින් අපගේ පාපය අත්හැරදැමීම මග නොහැරීමට ක්‍රියා කරනවාද...? මේ අන්තිම දවස්වල දී යෝවෙල් අනාගත අනාගත වක්තෘ ප්‍රකාශ කර තිබෙන පරිදි ආත්මික වැගිරීමේ ඒ පොරොන්දුව ස්වර්ගය විවර වී ප්‍රථම සහ අන්තිම වර්ෂාව ලෙස මුළු ලොවෙහිම ගලා යන්නේය. ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ සෙනඟව උන් වහන්සේගේ නාමයේ මහිමය උදෙසා කැළලක වත් රැලි හෝ එබඳු යමක් නැති වන පිණිස වෙන් කර ගන්නා සේක.

"අන්තිම වර්ෂා කාලයට ස්වාමීන් ස්වාමීන් වහන්සේගෙන් එනම් විදුලි කොට කොටවන ස්වාමීන් වහන්සේගෙන් වර්ෂාව ඉල්ලා පල්ලා. උන්වහන්සේ ද, ඔවුන්ට තද, වර්ෂාවත් එකිනෙකාට පිට්ටනියෙ තෘණත් දෙනවා ඇත. (සෙකරියා 10 : 1) "එබැවින් ස්වාමීන් වහන්සේ හැඳින ගනිමු. හැඳින ගන්නට වීර්ය කරමු. උන්වහන්සේගේ උදාවීම පහන් වීම මෙන්ම ඒකාන්තය. උන්වහන්සේ වර්ෂාව මෙන්ද, පොළොව තෙමන අන්තිම වර්ෂාව මෙන්ද, අප ළඟට එනවා ඇත. " (හොෂෙයා 6,3) "ධර්මිෂ්ඨකම පිණිස වපුරා සපුරාගෙන කරුණාවේ හැටියට කපා ගනිල්ලා. ස්වාමීන් වහන්සේ ඇවිත් නුඹලාට ධර්මිෂ්ඨකම වස් වනතුරු දැන් උන්වහන්සේ සොයන්නට කාලයයි. " (හොෂෙයා 10: 12)

ආත්මයාණන් වහන්සේගේ බලය සහ අභිමුඛත්වය

ආත්මයාණන් වහන්සේගේ බලය සහ අභිමුඛත්වය නැතුව සභාව බලාපොරොත්තු රහිත ව සිටිති. මනුෂ්‍යයාගේ උපක්‍රමවලින් සභාව බලවත් වන්නේ නැත.ප්‍රඥාවේ රහස සහ බලයේ දීමනා වල නොකඩවා නොපැවතීම සහ දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ කැමැත්ත නොසලකා හැර තිබෙන නිසා බොහෝ අවස්ථාවල දී සභාවේ තේජස නැති වී තිබේ. අවශ්‍යතාවයන් වෙනුවෙන් සභාවේ කාර්ය නොපමාව සිදුවූයේ නැත. ඉතා වැදගත් තීරණාත්මක අවස්ථාවක උපකාරයක් නොමැතිව සභාව පැකිලීමට හසුවීම මධ්‍යයේ සිටිති. සභාවට ආධිපත්‍ය අහිමි වී සිටින බව මතක තබා ගන්න. ව්‍යාකුල බව සහ අප්‍රාණික ක්‍රම බෙලහීන ක්‍රම වැළැක්විය නොහැකි වූ විට දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ බලය සහ අභිමුඛත්වය වෙනුවට ලෝකයේ උපක්‍රම සහ ප්‍රඥාව ආදේශ කරනු ලබති.

ආත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වය සභාවට අවශ්‍ය ප්‍රධාන සහ අත්‍යාවශ්‍ය දෙයයි. ඊට වඩා ප්‍රයෝජනවත් ව තිබෙන වෙන කිසිවක් නොමැත. දෙවියන් වහන්සේගෙන් වෙන් ව ලබාගන්නා වූ ප්‍රඥාව මෝඩකම හැටියටත් ශක්තිය දුර්වල කම ලෙසත් පවතින්නේය. ආත්මික සත්‍යතාවය දෙවියන් වහන්සේ එළිදරව් කරන තෙක් ප්‍රඥාව අන්ධ ව පවතී. දෙවියන් වහන්සේ ආත්මික ව පුබුදු වන තෙක් රූප නමස්කාරය ට ගොදුරු වී සිටිති. දෙවියන් වහන්සේගේ බලය ප්‍රකාශ නොවේ නම් දේශනා කිරීම බල රහිත ව තිබේ. දෙවියන් වහන්සේගේ බලය (ශක්තිය) ලබාදෙන්නේ නැතිනම් යාච්ඤා කිරීම නිශ්ඵල ව තිබේ. ඔවුන් තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ නැතිනම් මනුෂ්‍ය උපක්‍රම ඉගෙන ගැනීම සහ සංවිධාන සකස් කිරීම උද්යෝගය සහ සශ්‍රීකත්වය ප්‍රතිසංස්කරණය සහ ත්‍යාගවන්තකම ප්‍රයෝජනවත් වන්නේ නැත. සභාව සෑම විටම තමා ගැනම විශ්වාස තබා සිටින නිසා පරිහානියට පත්ව අසාර්ථකව සිටිති. විශාල පිරිසක් රැස් වූ වත් සභාව එකම රටුමක දුවමින් සිටින බැවින් දෙවියන් වහන්සේගේ ෂෙකයිනා මහිමය අත් විඳින්නේ නැත.

යාච්ඤා කිරීමේදී ඇදහිල්ල සෝදිසි කර බලන්නේ සහ බලය සැඟවී තිබෙන්නේ ඇයි ? දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේ තුළ ප්‍රසව වේදනාවෙන් යුක්තව යාච්ඤා කරන්න. හාස්කම් කෙලින්ම දෙවියන් වහන්සේගේ බලයේ ක්‍රියාවක් ලෙස සිදුවන අතර දෙවියන් වහන්සේගේ බලය නැතිව සභාවට හාස්කම් ඇති කළ නොහැකිය. ලෞකිකකමට හැකි වන්නේ වාද විවාද කිරීමට ය. නමුත් වරදකරු යැයි ප්‍රකාශ කිරීමට ආත්මයාණන් වහන්සේට හැකිව තිබෙන සේක. ශීලාචාර බව ඇති ඇතිකිරීමට අධ්‍යාපනයට හැකි වන්නේය. නමුත් මුදාගැනීම හටගැනීමට සැලැස්විය හැකි වන්නේ ආත්මයාණන් වහන්සේට වන සේක. මාංශයේ ශක්තියෙන් විනෝදාත්මක ක්‍රියාවන් සැලසුම් කරමින් මිලියන ගණන් සෙනඟ ව ඊට එකතු කර ගැනීමටත් හැකිය. නමුත් ජීවමාන දෙවියන් වහන්සේගේ මාලිගාව ගොඩනැගිය හැකිව තිබෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වය තුළ පමණි. වර්තමානයේ සභාව විපතට හසුවී තිබෙන ප්‍රධාන ප්‍රශ්නය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේට වඩා වැඩියෙන් ලෝකය සහ මාංශය කෙරෙහි විශ්වාස කිරීමයි. එමෙන්ම අපි නැවත හැරී උන් වහන්සේගේ බලය සහ අභිමු. කත්වය අවබෝධ කරගන්නා තෙක් කාරණා යහපත් වන්නේ නැත. වියළි ඇට කටු වලට සතර දිසාවෙන්ම සුළං හමා ගෙන ආවත් ඒවා මහත් සේනාවක් ලෙස සිට ගනු ලැබීමට සැලැස්විය හැකි වන්නේ යාච්ඤා කිරීම කරුණු කොටගෙන පමණි.

ශුද්ධාත්මයාණන් වහන්සේගේ දීමනා

පුද්ගලික මනුෂ්‍යයා සහ මුළු සමාගම තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය පෙන්තකොස්ත දවසේ සිදුවීම තුළින් අනාවරණය වේ. සූර්යාගේ දීප්තිය මෙන් දෙවියන් වහන්සේගේ ආලෝකය ප්‍රේත්‍රැස් තුළ ක්‍රියාත්මක විය. මනුෂ්‍යයෙක් වශයෙන් බොහෝ අසාර්ථක වීම් වලට හසුවී සිටියත් සුභාරංචියේ සිදුවීම් පෙළ එක දිගට ක්‍රියාවට නැගීමට උදාර ලෙස යොමු වූයේය. ඔහුගේ පරීක්ෂා පැයේ දී නිතර ම අසාර්ථක වීම සහ ඔහුගේ පැකිලීමෙන් සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේ ඔහුව හරවා ගැනීමත් සමග පෙන්තකොස්ත දවසේ දී ඔහු තුළින් එය අනාවරණය වූයේ ය. ඔහු ස්ථිරව (නිසැකව) ඔහුගේ දේශනාවේදී සත්‍යතාවය පැහැදිලි කළ අතර ඔහු තුළ තිබෙන්නා වූ පරාජය කළ නොහැකි බලය පිළිබඳ දැඩි විශ්වාසය ඇතිව සිටියේය. ප්‍රේකැස් ඊට දින කිහිපයකට පෙර කෙලින් සිට ගන්නටවත් බැරිව හියෙන් පැකිලි සහ සැඟවී සම්පූර්ණයෙන්ම අසරණ ව සිටියා වූ මනුෂ්‍යයෙක් වූයේය. සිතේ ස්වභාවය සහ ස්වභාවික නැඹුරුව තත්වය වෙනස් නොවී පැවතුණ නමුත් දැන් දීප්තිමත් තරු ශක්තියක් සමඟ ආත්මය අලුත් වී වෙනස් වීම නිසා අලුතින් ලැබුණා වූ බලයෙන් බලපෑමක් ඇති කළේය. කලින් සිටියා වූ ගලීල යන්ටම ඔහු කතා කළ නමුත් දැන් කතා කළේ ශුද්ධාත්මයාණන් වහන්සේ කියන ආකාරයටය.

පාවුල්තුමා කතා කරන විට එම සත්‍යතාවය ම ඔහු වෙනත් ආකාරයකට ප්‍රකාශ කළේය. ***"මම ක්‍රිස්තුස් වහන්සේ සමග කුරුසයේ හි ඇණ ගසනු ලැබ සිටිමි. එසේ නමුත් මම ජීවත් වෙමි. නමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත් වන සේක. තවද, මා දැන් මාංශයේ එහි ජීවත් වන ජීවිතය මට ප්‍රේම කළා වූ මා උදෙසා තමන් ම පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි . "*** (ගලාති 2:20) මනුෂ්‍යයාව

සැමුවෙල් වැඩිවික් විසිනි.

පාපයෙන් මුදාගෙන ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභිමුඛත්වයේ වාසය කිරීමට වරප්‍රසාදය දෙනු ලැබූ විට ***" මම ජීවත් වෙමි. නමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත් වන සේක"*** කියා පාවුල්තුමා පැවසුවේය .

අපෝස්තුළුවරයා සියලුම ආත්මික සපලත්වය ආත්මයාණන් වහන්සේ තුළ වාසය කිරීමේ බලයට අඩංගු කර දක්වන්නේය . ***"එහෙත් අපෙන්ම වුණත් මෙන් අප තුළින්ම යමක් යෝජනා කරන්නට අපගේ සමර්ථකමක් නැත. අපගේ සමර්ථකම දෙවියන් වහන්සේගෙන් ය . තවද, උන් උන්වහන්සේ අලුත් ගිවිසුමක සේවකයන් කොට අප සමර්ථ කළ සේක. එනම් වචනාර්ථය හැටියට නොව පරමාර්ථය හැටියටය . මක්නිසාද, වචනාර්ථය නසන්නේය. පරමාර්ථය ජීවත් කරන්නේය. "*** (2 කොරාන්ති 3:5-6) ආත්මයාණන් වහන්සේ තුළින් දෙවියන් වහන්සේ වෙතට පැමිණීමට වඩා වෙනත් ආකාරයේ ශක්තීන් වෙතට යොමු වීම නිසා විනාශකාරී දේ සමඟ සමඟ සහජීවන දායක නොවන දේ සමග ඔවුන් කටයුතු කරමින් සිටිති. සියලුම දේ බිඳ වැටීමට පෙර ඉතා ඉක්මනින් ආත්මයාණන් වහන්සේ වෙතට පැමිණෙන්න. මනුෂ්‍යයාගේ ක්‍රමය පිළිවෙල අතිශය විශිෂ්ට විය හැකිය. අතිශය ප්‍රබල උනන්දුවක් තිබෙනවා විය හැකිය. නමුත් මැවුම්කරුවාණෝ දෙවියන් වහන්සේ පමණක් වන සේක. දෙවියන් වහන්සේ නිර්මාණාත්මක කාර්යන්ට ප්‍රබෝධ කරන සේක. උපකාර කිරීමට උන්වහන්සේට හැකියාව තිබෙන සේක . ලෞකිකත්වය විනාශ කර දමමු. දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ බලය ප්‍රබෝධයෙන් චරිතය සම්පූර්ණයෙන්ම වෙනස් වීම සහ සම්පූර්ණ කිරීම සිදු වන්නේය. එහිදී සභාව තුළ මනුෂ්‍ය ශක්තියෙන් ලැබෙන සම්පූර්ණත්වය සිදු වන්නේ නැත. අලුත් ජෙරුසෙලම බබිලෝනියේ බලයෙන් ගොඩනැගෙන්නේ නැත. එය ස්වර්ගීය දෙවියන් වහන්සේ වෙතින් පැමිණෙන සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ නොමැතිව ඇදහිලි වන්තයාට ආත්මෙන් ක්‍රියා කළ නොහැකිය.

අපේක්ෂා කළ නොහැකි මනුෂ්‍යයන් තුළින් ආත්මයාණන් වහන්සේ ක්‍රියා කරන සේක.

මෙම රහස සභාව සමඟ ඉතිහාසයෙදි සම්පූර්ණ වී තිබේ. අදක්ෂ මනුස්සයන් සෑම විටම කර නොහැකි කාරණාවන් ඉටු කරන්නේය. ඒ තුළින් පොදු මනුෂ්‍යයාට අසාමාන්‍ය අපූර්ව වූ ප්‍රතිඵල ලැබේ. දෙවියන් ව හන්සේ විශාල වූ කාරණා සිදු කළ

8 පිටුවට

Reg. No: QD/111/පුවත්/2021
30/7,A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

ආත්මයාණන් වහන්සේගේ...

7 පිටුවෙන්

හැකි යැයි කිසිසේත් සිතන්නට බැරි පුද්ගලයන් කරුණු කොටගෙන ඒවා ඉටු කරන සේක. දාවිත් කරුණු කොටගෙන ගෝල්යත්ව විනාශ කර දැමූ සේක. උගතුන්ගෙන් ප්‍රඥාවන්තයින් ගෙන් කාරණා සඟවා අඥානයන්ට සහ නූගත් අයට එය එළිදරව් කරන සේක. බලවන්තයන් ව විශ්මිත කරන පිණිස දුර්වලයන් ව පාවිච්චි කරන සේක. ප්‍රඥාවන්තයින් ගේ ප්‍රඥාව නිශ්ඵල කමට මෝඩ කමට හරවන නිසා සියලු ප්‍රඥාවන්තයින් තුළ සතුටක් පෙනෙන්නට නැත. උඩඟුකමේ ශක්තිය ලැජ්ජාවට හරවන සේක. සාමාන්‍යයෙන් මනුෂ්‍යයන්ට කළ නොහැකි දේ උන්වහන්සේ තුළ කළ හැකි බව ප්‍රකාශකර තිබෙන සේක. තර්කානුකූල උඩඟුකම නිපුණතාව, උඩඟුකම, පුද්ගලිකත්වයේ උඩඟුකම, බලයේ උඩඟුකම ආදී තත්වයන් බාබෙල් කොකු ගොඩනැගීමේ ආත්මය තුළ තිබුණි. දෙවියන් වහන්සේගේ සභාව තුළත් එම ස්වභාවයන් ම පවතින නිසා වැළැක්විය නොහැකි ප්‍රතිඵල ලැබී ඇත. අවසානයේදී පරාජය විනාශය අගෞරවය හිමි වී තිබේ. එහිදී දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේ කරුණු කොටගෙන ලෝකයේ න් ජය ගැනීමට හැකියාවක් නොමැති ව සිටිති. දෙවියන් වහන්සේගෙන් වෙන්ව සිටින නිසා ලෝකයේ වරදකරුවන් වන්නෝය. ***"උන්වහන්සේ ආ කල පාපය ගැන ද, ධර්මිෂ්ඨකම ගැන ද, විනිශ්චය ගැන ද, ලෝකයට අඟවා දෙන සේක"*** (යොහාන් 16:8) වෙනත් කිසිදු බලයකට එය කළ නොහැකිය. දැඩි විශ්වාසයක් නැතිව මනුෂ්‍යයා ගැළවීම ලබා දේව රාජ්‍යයට පැමිණෙන්නේ නැත.

අපට ආත්මයාණන් වහන්සේගේ බලයෙන් ක්‍රියා කිරීමට හැකිව තිබෙනවා ද...?

දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ දීමනා බලපෑමකින් යුතුව සාක්ෂි දැරීමට, ශුද්ධ වූ ජීවිතයක් ගත කිරීමට කැපවීමෙන් සේවය කිරීමට අවශ්‍ය බලයේ දීමනා වන්නේය. පෙන්තකොස්ත දවසේ පූර්ණ වූ තත්වයේ ප්‍රමාණයෙන් අපි කටයුතු කරනවාද...? පාපයට ඉහළින් අපි බලය ලබා තිබෙනවා ද ? සත්‍යථාවයේ ආත්මයාණන් වහන්සේ ශුද්ධකමේ ආත්මයාණන් වහන්සේ ද වන සේක. පෙන්තකොස්ත දවසේ දී ආත්මික දර්ශනය තුළ ගෝලයන්ගේ ලෞකික සිතිවිලි වෙනස් වී උඩඟුකම යටහත් කමටත්, ආත්මාර්ථකාමී බව ප්‍රේමයටත්, බියගුලුකම නිර්භීත කමටත් හරවනු ලබන්නේය. එහිදී හදවත් වෙනස් වී, ජීවිත පරිවර්තනය වී, පූර්ණත්වය කරුණු කොටගෙන ජයග්‍රහණයට පැමිණියෝය. පාපයෙන් ජය ගැනීමේ ප්‍රීතිය අපි ලබා තිබෙනවා ද ? කිතුනුවන් ගේ චරිතය ඕනෑම ස්ථානයකදී ආත්මෙන් පිරුණාවූ තත්ත්වයට සමීප වෙනවද ..? ලෝකයට ප්‍රේම කරන්නට සිදු වන්නේ කුමක්ද...?ලෝකයාට ශුද්ධාත්මයාණන් වහන්සේව පිළිගන්නට බැරි බව යේසුස් වහන්සේ පැවසූ සේක.***"ඒ සැනසිලිකාරයාණෝ සත්‍යතාවය ආත්මයාණන් වහන්සේ ය. උන් වහන්සේව පිළිගන්නට ලෝකයාට බැරිය. මක්නිසාද, ලෝකයා උන් වහන්සේව දකින්නේවත් අඳුනන්නේ වත් නැත. නුඹලා උන්වහන්සේ හඳුනන්නහු ය. මක්නිසාද, උන්වහන්සේ නුඹලා සමග නැවතී සිටින සේක. නුඹලා තුළහි සිටින සේක. "*** (යොහාන් 14:17) ලෝකයේ අය පරස්පර විරෝධී වීම තුළ සක්‍රීය ලෙස විරුද්ධ කම ප්‍රකාශ කරනු ලබන්නෝය. ඇදහිල්ලෙන් (දේව ධර්මයෙන්) වෙන්වීමෙන් පැමිණ තිබෙන්නේ කුමක්ද? ඇදහිලිවන්තයන් ශුද්ධාත්මයාණන් වහන්සේ ගෙන් පිරෙන්නේ නම් ඔවුන් අඛණ්ඩව ලෝකයේ සිත් අවුස්සන කාරණා වලට සහ බීමට නොහැකි වූ තිත්ත දිය නිකුත් කරන්නා උල්පත් වලට ඉඩ හරින්නේ නැත. නිෂ්ඵල ක්‍රියාවන් වල පූර්ණත්වය ප්‍රකාශ කිරීමට සහ ඒ තුළ ගමන් කිරීමට පිපාසිතව තමා ගැන ඇති මාන්නය (පුහු ආටෝපය) සමග දැඩි උවමනාවෙන් කටයුතු කරන්නේද නැත.

සේවය සඳහා අවශ්‍ය බලය ගැන සිදුවන්නේ කුමක්ද...? අපේ පිරිහීමට නිශ්චිතව ම හේතු වන්නේ බාහිර ව්‍යාකූලත්වයන් හෝ ඇතුළාන්ත දුර්වලතාවයන් ද? දේව සේවකයන්ගෙන් විශාල සංඛ්‍යාවක් මහත් ලෙස ඔවුන්ගේ සේවයේ විවිධත්වයන් තුළ දැඩි උද්යෝගයෙන් නව නිර්මාණාත්මක මෙහි කිරීමෙහි දක්ෂ වුවත් ප්‍රතිඵල ලබන්න අල්ප වශයෙන් යැයි සිතමි. මනුෂ්‍යයන්ගේ ජීවිත වලට සභාව ලබාදී තිබෙන්නා වූ බලපෑම කුමක්ද? සම්පූර්ණයෙන්ම විනාශ වී යාමෙන් හරවා ගැනීමට කරන්නේ කුමක්ද...? දෙවියන් වහන්සේගේ ආත්මයාණන් වහන්සේගේ දීමනාවන් වන බලයේ දීමනාවන් වල සහ උන්වහන්සේ තුළ පූර්ණ ව වාසය නොකරන නිසා අපේක්ෂිත බලය නිශ්චිතවම නොමැතිව සිටින්නෝය.

පෙන්තකොස්ත දවසේ පූර්ණත්වයට කැඳවන සේක.

සැකයක් නොමැතිව පෙන්තකොස්ත ව දවසේ පූර්ණත්වය සභාවට අවශ්‍ය ව තිබේ. වැදගම්මකට නැති සියලු කාරණා පැතිරීයාම ඉවත දමා, සියලු ඉවුරු දක්වා උතුරා යන සහ සියලු කාන්තාර සාරවත් කරන ජලගැල්ම ලබාගැනීම අවශ්‍ය වේ. ආත්මයාණන් වහන්සේගේ පූර්ණත්වය නොමැතිව දෙවියන් වහන්සේගේ කාරණා සම්පූර්ණ කළ නොහැකිය. දෙවියන් වහන්සේගෙන් ඉල්ලන්නා වූ සෑම දෙනාට උන්වහන්සේගේ ආත්මයාණන් වහන්සේව ලබාදීමට දෙවියන් වහන්සේ බලා සිටින සේක. දෙවියන් වහන්සේගේ කැමැත්ත වන්නේ සෑම ඇදහිලිවන්තයෙක් ම දෙවියන් වහන්සේ ආත්මෙන් පූර්ණ වී උතුරා යන්නාවූ ආත්මයාණන් වහන්සේගේ බලයෙන් සියලුම කාරණා වලින් ජය ගැනීම වන සේක. එය වළක්වන්නේ කුමක්ද? දෙවියන් වහන්සේගේ ආශිර්වාදය සියළුදෙනා වෙනුවෙන් වන සේක. ඊට අවශ්‍ය සුදුසුකම් සංකීර්ණ නොවූ, වෙනස් කළ නොහැකි සහ සෑම දෙනාටම දෙනාට ම පොදු වූ කාරණා වශයෙන් තිබේ. සාමාන්‍ය පුද්ගලයන්ව අසාමාන්‍ය බලයෙන් පූර්ණ කිරීමට සහ ඇදහිල්ලේ ජයග්‍රහණය තුළින් උද්‍යෝගය ඇති කිරීමට බාධා කරන්නාවූ දේවලින් හරවා ගැනීමට දෙවියන් වහන්සේ බලා සිටින සේක.

ඇදහිල්ලේ පියවර

ඇදහිල්ල කරුණ කොටගෙන ආශිර්වාද ලබාගැනීමට අවශ්‍ය වන්නාවූ පියවර මොනවාද ..?

පළමුවන පියවර "පසුතැවිලි වීමයි " ***"පේත්‍රුස් නුඹලා සියල්ලෝම පසුතැවිලි ව පව් කමාව පිණිස ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් බව්තීස්මය ලබා පල්ලා. එවිට ශුද්ධාත්ම දීමනාව උඹලා ලබන්නාහුය "*** (ක්‍රියා 2; 38) මෙහිදී පව් කරුවන් මෙන්ම ඇදහිලි වන්තයින් ද පසුතැවිලි විය යුතුය. මනුෂ්‍යයින් පාපය ඒත්තු ගෙන පසුතැවිලි වීම තුළ යාච්ඤා කිරීමට ආරම්භ කරන විට පෙන්තකොස්ත දවසේ ආශිර්වාදය පිළිතුරු ලෙස ලැබෙන්නේ ය. බලාපොරොත්තුවෙ කාරණාවන් අත්හැර දමන්නට සිදු වන්නේ නැත. නිදහසේ ආශාවන්හි ගැලීමට, ආලෝකයට විරුද්ධ දේ රඳවා තබා ගැනීමට, ආත්මාර්ථකාමී ලෙස වස්තුව ලබා ගැනීමට ඉඩ ලබා නොදී ක්‍රිස්තුස්වහන්සේගේ අති ශ්ෂ්ඨ වූ ආධිපත්‍යයට යටත් වෙන්න. එවිට පෙන්තකොස්ත දවසේ දී මෙන් ක්‍රිස්තුස් වහන්සේව උසස් කිරීම, මහිමයට පත් කිරීම, මුදුන් පැමිණවීම සිදු වන්නේය. පෙන්තකොස්තයට මිස වෙන දෙයකට එය කළ නොහැකිය.

" ඉල්ලා සිටීම " දෙවන පියවරයි. ***"මෙසේ නපුරු වූ නුඹලා නුඹලාගේ දරුවන් ට යහපත් දේ, දෙන්ට දනිව් නම් කොපමණ වැඩියෙන් උඹලගේ ස්වර්ගීය පියාණන් වහන්සේ තමන් වහන්සේගේ ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙන සේක් ද යි කීසේක. "*** (ලූක් 11;13) මෙහිදී විශේෂ වූ දීමනාවක් වෙනුවෙන් නිශ්චිතව ඉල්ලා සිටීම අවශ්‍ය ය. අවුරුදු කිහිපයකට පෙර යාච්ඤාව පිළිබඳව මම ගොවියෙක් සමග කතා කළෙමි. එම ගොවියා මෙසේ කීවේය." බොහෝ දේශකයන් යාච්ඤා රැස්වීමට පැමිණෙන්නැයි සෙනඟට කියනවා මම අසා ඇත්තෙමි. නමුත් යාච්ඤා කිරීමේ කාර්යය අතපසු වන විට ඒ සඳහා ඇති කැමැත්ත ද හීන වී යන්නේ ය" මෙහිදී අයද සිටීම ඉලක්ක කර ගැනීමට ආශා වීම අවශ්‍ය ය. යාකොබ් යැවුම් පත්‍රයේ මෙසේ පවසා ති බේ. ***"නුඹලා ආශාවන්නහු ය. නමුත් නොලැබෙන්නේය. නුඹලා මිනී මරන්නහු ය. ඊර්ෂ්‍යා වන්නහු ය. නමුත් ලබාගන්නට බැරි වන්නානේය. නුඹලා ඛඩර ද යුද්ධ ද, කරන්නාහුය. නුඹලා නොඉල්ලන්න බැවින් ඔබලාට නොලැබෙන්නේය. "*** (යකොබ් 4:2)

දහස් ගණන් ඇදහිලි වන්තයන් ආශිර්වාදය සඳහා නිශ්චිතවම ඉල්ලා සිටින්නේ නැත. ආශිර්වාදය ලබා දීමට දෙවියන් වහන්සේ බලා සිටින සේක. නමුත් අපගේ අයද සිටිනවාට වඩා උන්වහන්සේ කැමැත්තෙන් සිටින සෝක. "නුඹලා වටකර ඉතිරිවෙන ජාතීන්ද ස්වාමීන් වහන්සේ වන මා විසින් ජරාවාස වූ වවන්ටන් තැන් නගන්නටත් පාළු වූ ඉඩම් යෙදුන බව දැන දැනගන්න හුය. ස්වාමීන් වහන්සේ වන මම ඒක කීවෙමි. ඒක කරන්නෙමි. ස්වාමිවූ දෙවියන්වහන්සේ මෙසේ කියන සේක. මෙම ඊශ්‍රායෙල් වංශයට කරන ලෙස මම ඔවුන්ගේ ඉල්ලීමට තවදුරටත් ඇහුම්කන් දෙන්නෙමි. රැලක් මෙන් ඔවුන්ගේ ගණන වැඩි කරන්නෙමි (එසකියෙල් 36:36-37)

වරදවා වටහාගෙන ඉල්ලා සිටීම නොකිරීමට අපි ප්‍රවේශම් විය යුතුය. වැරදි අභිප්‍රාය නිසා ඇදහිල්ලේ නිසි ඵල ලබා ගැනීම වැළකී යන්නේය. ***" එකම දෙවියන් වහන්සේ කෙරෙන් පැමිණෙන ගෞරවය නොසොය,*** ***එකිනෙකාගෙන් ගෞරවය ලබන්නා වූ නුඹලාට විශ්වාස කරන්නට පුළුවන් කොහොමද..?"*** (යොහාන්4:3) ප්‍රීතිය නීත්‍යානුකූලව සහ ප්‍රමාණවත් ලෙස පැවතීම ප්‍රශංසනීය වුවත් දෙවියන් වහන්සේ උන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ මහිමය වෙන කෙනෙකුට ලබා නොදෙන සේක. ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය තුළින් පුත්‍රයාණන් වහන්සේ මහිමයට පැමිණෙන සේක. කිතුනු සේවය තුළ සාර්ථක වීම උදෙසා බලය අවශ්‍ය බව පැහැදිලිව පෙනෙන්නේය . ක්‍රිස්තුස් වහන්සේගේ ශේෂ්ඨත්වය තුළ ඉලක්කය තබා ගත යුතුය.

තුන්වන පියවර "ලබාගැනීමයි ". ඇදහිල්ලේ ක්‍රියාවට සම්පූර්ණයෙන්ම කැප වන විට ශුද්ධාත්මයාණන් වහන්සේව ලබා ගැනීම පහසු වේ.සියලු ආඥාවන් ඒ තුළ අඩංගු වී තිබේ.***"එබැවින් ඔබලාට කියමි. නුඹලා යාඥා කොට ඉල්ලන මොන දෙයක් වුවත් ඒ සියල්ල නුඹලාට ලැබුණේ යැයි අදහාපල්ලා. ඒවා නුඹලාට ලැබෙන්නේ ය "*** (මාර්ක් 11;24)

.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැඟී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත,
මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක 47 දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.